## බළන්ගොඩ නගර සභාව

## 2025.12.09 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2025.12.09**

**වේලාව -පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | කේ.ජී පේමදාස මැතිතුමා |
| 2. ගරු උප සභාපති | පේෂල නිකලන්ද මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රූමි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රීනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් චන්දන මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 16. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

**01. පසුගිය සභාවේ සභා වාර්තාව සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2025-11-11 දිනැති මහා සභා වාර්තාව සහ 2025-11-21 දිනැති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් 2025-11-11 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් සභා වාර්තාවල සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, එහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා, 2025-11-21 දිනැති මහ සභාවේ සභා වාර්තාවේ 9 වැනි පිටුවේ තමාගේ කතාවේ පන්සල් පල්ලි වලට යා නොහැකි තත්වයක් උද්ගත වී ඇති බව පැවසූ පසු සභාපතිතුමාගේ අදහස් දැක්වීම සභා වාර්තාවේ ඇතුලත් නොවන බවත්, එදා පැවසූ පරිදි අදවන විට රට මුහුණදුන් ස්වභාවික ආපදා තත්වය හමුවේ මිනිසුන්ට යාමට ඉතිරි වී ඇත්තේ පාසල්,පන්සල්,පල්ලි පමණක් බවත්,ඒවාට සේවාවක් නොම්ලේ සැපයීම පිළිබඳව තමන් එදා කතා කලේ ඒ හේතුවෙන් බවත් සඳහන් කරන ලදී.ඒ අනුව ගරු සභාපතිතුමා පැවසූයේ එලෙස ඉවත් කරන ලෙස පවසා නැති බවත්, එය සංශෝධන වලට ඇතුළත් කරන ලෙසත්ය.ඒ අනුව 2025-11-11 දිනැති මහ සභාවේ සහ 2025-11-21 දිනැති මහ සභාවේ සභා වාර්තා සංශෝධනයන්ට යටත්ව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

අදදින සභාවේ නිවේදන නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**03. සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

අදදින සභාවේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**04. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම**

- ❖ බළන්ගොඩ දෙවැට පාර පිළිසකර කිරීම සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමාගෙන් කරන ලද ඉල්ලීම ඉතා සාර්ථකව ඉටුකර ඇති බවත්, ඒ සම්බන්ධව එතුමාට ස්තූතිය පුද කරන බවත් දන්වමින් බළන්ගොඩ වරිපනම් බදු ගෙවන්නන්ගේ සංගමයේ සභාපති පී.එම්.එල් සිල්වා මහතා යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
- ❖ ඇල්ලෙඅරාව, බළන්ගොඩ,එක්සත් මාවතෙහි ජීවත් වන පවුල් 20ක පමණ ප්‍රමාණයකට ජලය ලබා ගැනීමට ප්‍රමාණවත්, විධිමත් ක්‍රමවේදයක් නොතිබූ බවත්, එබැවින් ප්‍රදේශවාසීන් හා එක්ව නළ ළිං පද්ධතියක් සකස් කරගත් බවත්, එයින් ජලය බෙදා දීම සඳහා ලීටර් 10000 පමණ ජල ටැංකියක් සහ නිවෙස් වෙත ජලය බෙදාදීම සඳහා ජලනල පද්ධතියක් අවශ්‍යව ඇති බවත්, ඒ සඳහා විශාල මුදලක් වැය වන බවත්, ඒ සඳහා ජල ටැංකියක් සහ ජලනල පද්ධතියක් ලබා දෙන ලෙසත් දන්වමින් ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා මඟින් ගම්වාසීන් යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමා මෙහිදී පැවසුයේ ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා යන මන්ත්‍රීතුමන්ලාගේ 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබාදෙන රු.75,000 මුදල ඒ සඳහා යොදවන බවට දන්වා ඇති බැවින්,තවත් ඒ සඳහා හිඟ ප්‍රතිපාදන වේ නම් සභාවෙන් යොදවා ජල අවශ්‍යතාවය පොදු කටයුත්තක් බැවින් සිදු කිරීම සුදුසු බවයි.

- ❖ බළන්ගොඩ නගර සභාව සතු ක්‍රීඩා පිටියේ ක්‍රිකට් ක්‍රීඩා කරන පිච් එක මුළුමනින්ම අළුත්වැඩියා කර සැකසීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් පස් ප්‍රවාහනය සඳහා ලොරි රථයක්, පිටිය තැලීම සඳහා රෝලර් මැෂිමක් සහ කම්කරුවන් දෙදෙනෙකු ලබා දෙන ලෙසත් ඉල්ලා රන්මුතු ක්‍රීඩා සමාජය විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
  මෙහිදී සභාවේ අදහස් අනුව මේ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමටත්, වැඩ අධිකාරී මහතාගේ අධීක්ෂණය යටතේ සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා පවසන ලදී.

- ❖ සිවිල් ආරක්ෂක භටයින් දෙදෙනෙකුගේ සේවය ලබා ගැනීම සඳහා ආරක්ෂක සේවා සැපයීම සම්බන්ධව අනුමත මිල ගණන් සහ ගිවිසුම්ගත වී සේවාව ලබා දෙන බවත්, ඒ අනුව ඉදිරිපත් කර ඇති මිල ගණන් යටතේ සේවාව ලබා ගැනීමට එකඟවන්නේ නම් දින 14ක් ඇතුළත දන්වන ලෙසත් දැනුම් දෙමින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා මේ සඳහා ගෙවීමක් සිදු කළ යුතුද යන්න විමසන ලදී.ගරු සභාපතිතුමා පැවසුයේ පැය 12ක සේවා මුරයක් සඳහා රු.1800 ක මුදලක් ගෙවිය යුතු බවයි.වැඩිදුරටත් ගරු සභාපතිතුමා පැවසුයේ යොදවා ඇති මුර සේවාව පිළිබඳ සෑහිමකට පත් වීමට නොහැකි බවත්, දැනට මුර සේවයේ ස්ථිර 03දෙනෙකු පමණක් සිටින බවත්,වෙනත් තනතුරු දරන සේවකයන් අවශ්‍යතාවය අනුව මුර සේවයේ යොදවා ඇති බවත්, ආරක්ෂක සේවාව විධිමත් කිරීමේ අරමුණින් මෙලෙස ආරක්ෂක සේවාව සඳහා සිවිල් ආරක්ෂක බටයින් දෙදෙනෙකුගේ සේවාව ලබා ගැනීමට බලාපොරොත්තු වන බවත්ය.
ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පැවසුයේ ගරු සභාපතිතුමාගේ කල් දී ඇති යෝජනාවක් මේ සම්බන්ධයෙන් වන බැවින් එම අවස්ථාවේදී මේ පිළිබඳ සාකච්ඡා කිරීම සුදුසු බවයි.

- "මට හැටයි කතා හැටයි දෙයියෝ සාක්කි " කෘතියේ පිටපත් කිහිපයක් පුස්තකාලයට මිලදීගෙන සාහිත්‍ය කලා කටයුතු වලට උදව් උපකාර කරන ලෙස ජනමාධ්‍යවේදී වයි.ඒ සරත් වීරවංශ මහතා යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.ඒ අනුව පුස්තකාලයේ අවශ්‍යතාවය අනුව  පිටපත් ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා පවසන ලදී.

- බළන්ගොඩ රාස්සගල පාරේ පොදු සුසාන භූමිය තුළ මායිමට ඇති ගස්වල අතු කපා ඉවත් කර දෙන ලෙස රිෂානා සර්විස් ස්ටේෂන් ආයතනය විසින් යොමු කර ඇති ලිපිය ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. එම ලිපිය 2025.09.09 දිනැතිව සභාවට යොමු කර ඇති බවත් එතුමා වෙත පිටපත ලැබී ඇති බවත් එතුමා වැඩිදුරටත් පවසන ලදී.

  මෙහිදී ගරු සභාපතිතුමන් විසින් එම ලිපිය සභාපතිතුමාට ලැබී නොමැති බවත්, කෙසේ නමුත් බුලත්ගම පොදු සුසානභූමියේ පවතින අනතුරුදායක ගස් 06ක අතු කැපීම සඳහා මිල ගණන් කැඳවා ඇති බවත්, ඒ අනුව කඩිනමින් එම ගස් අතු කැපීමේ කටයුතු සිදු කරන බවත් සඳහන් කරන ලදී.

- බළන්ගොඩ දෙහිගස්තලාව ග්‍රාම නිලධාරී වසමේ යශෝධරා හා ජෙයිලානි විදුහල් පිටුපස අක්කර 4.5 ක පමණ ඉඩම් කට්ටි කොටසේ ඉඩම් හිමියන් 14 දෙනෙකු සිටින බවත් මෙම ඉඩම් කොටස් සඳහා ප්‍රවේශවීමට වසන්ත මහතාගේ නිවස අසලින් ඇති අඩි 150ක පමණ කුඹුරු කොටසින්  වන ප්‍රවේශ මාර්ගය  හැර වෙනත් කිසිඳු ප්‍රවේශ මාර්ගයක් නොමැති බවත් වසර ගණනාවක් තිස්සේ මෙම ප්‍රවේශ මාර්ගය ලබා ගැනීමට ඉල්ලීම් සිදු කළද ඉටු වී නොමැති බවත්, මීට අදාළව 2021 වර්ෂයේ සිට නඩු කටයුත්තක්ද විභාග වෙමින් පවතින

බවත්, මෙම ප්‍රවේශ මාර්ගය ලබා ගැනීම සම්බන්ධයෙන් පවතින ආරවුල් සම්බන්ධවත්, ප්‍රවේශ මාර්ගයට රජයේ තක්සේරු වටිනාකම ගෙවීමට එම ඉඩම් හිමියන් එකඟ බවත් ඒ වෙනුවෙන් අවශ්‍ය කටයුතු ඉටු කර දෙන ලෙසත් දන්වමින් මහවත්ත බෝගහවත්ත ඉඩම් කට්ටි ප්‍රතිලාභීන් යොමුකර ඇති ලිපිය ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් සභාගත කරන ලදී.

දෙහිගස්තලාව කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරුන් ලෙස තමන් දෙපලටම එම ලිපි නොලැබුන බව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් මෙහිදී පවසන ලදී.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසූයේ තමන්ටද පිටපත් සහිතව මෙම ලිපිය සභාව වෙත යොමු කර ඇති බවත්, නගර සභාව ප්‍රවේශ මාර්ග ලබා දීම වෙනුවෙන් බැඳී සිටින බැවින් සියළුදෙනා සාමුහිකව මෙම ගැටළුව විසඳිය යුතු බවත්ය.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ මෙම ගැටළුව ඉදිරිපත් කළ මහතා විසින් තමන්වද ඒ පිළිබඳව දැනුවත් කළ බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා පැවසූයේ මෙම ගැටළුව පිළිබඳව ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ඡා කළ බවත්,මෙම ගැටළුව වසර දෙක තුනක පමණ සිට පවතින ගැටළුවක් බවත්, ග්‍රාම නිලධාරි ප්‍රාදේශීය ලේකම් සහ මෙම ඉඩම් හිමියන් යන පාර්ශව සමඟ සාකච්ඡා වට දෙක තුනක් පැවැත්වූ බවත්, නගර සභාවට ඉඩම් පවරා ගැනීමට හැකියාවක් නොමැති බැවින් ප්‍රවේශ මාර්ගයට අයත් ඉඩම් පවරා ගැනීමේ ගැනීමේ කටයුතු සිදු කිරීමට ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලීම් කිරීම සුදුසු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා මෙම ලිපියෙන් ඉදිරිපත් කරන ලද ගැටළුව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කිරීම සුදුසු බවත් ඒ අනුව එම ප්‍රදේශවාසීන්ට සාධාරණයක් ඉටු කිරීම සුදුසු බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසූයේ මෙම දක්වා ඇති ඉඩමේ අඩියක වත් පාරක් නොමැති බවත්, භුක්තියට පමණක් ප්‍රවේශ මාර්ගයක් ඉල්ලා සිටින බවත්, ඉඩම් හිමියන් සමඟ සාකච්ඡා කර මාර්ගයක් ලබා ගැනීමේ හැකියාවක් පවතින බවත්ය.

ඒ අනුව ඉහත ප්‍රවේශ මාර්ගය සම්බන්ධ ගැටළුව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා පවසන ලදී.

❖ අසළ නිවසකින් හා බෝධියකින් වැසි ජලය නිවසට ගලා එන බව පවසමින් සභාව මැදිහත්වී ගැටළුව නිරාකරණය කර දෙන ලෙස , නො.348, බුලත්ගම, බළන්ගොඩ ලිපිනයේ පදිංචි අයි.නයනා ප්‍රියන්ති මංගලිකා යන අය යොමු කර ඇති ලිපිය ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් භාරදෙන ලදුව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ ඉහත ලිපිය ඉදිරිපත් කරන ලද මහත්මිය විසින් එම ආරවුලට සම්බන්ධ අනෙක් පාර්ශවය වෙත ප්‍රවේශ මාර්ගයක්ද ලබා දී ඇති බවත්, නිවස ඉදිකිරීම සඳහා ගොඩනැගිලි සැලසුම් අනුමත කර නොමැති බවත්, ඉඩම මිලදී ගැනීමේදී ප්‍රවේශ මාර්ගයක් නොතිබූ බවත්,වැසි ජලය අවිධිමත්ව ගලා යෑමක් පිළිබඳව ගැටළුව ඇති වී ඇති බැවින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීම සුදුසු බවත්ය.ඒ අනුව ඉහත ගැටළුව පිළිබඳ වැඩ අධිකාරීතුමා මඟින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා පවසන ලදී.

❖ නිවසට ඉහළින් ඇති අනාරක්ෂිත පස් කන්දක් පිළිබඳව දන්වමින් කිරිදිගල ජනපදපාර පදිංචි එච්.නිර්මලී මේරියන් යන අය යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමන් මෙහිදී පැවසුයේ මීට අදාළ අනෙකුත් පාර්ශවයද සභාවට පැමිණ සභාපතිතුමා සමඟ සාකච්ඡා කළ බවත්, මීට පෙර එම පස් කන්ද ගොඩකර ඉදිකළ තාප්පයකින් හානියක් සිදු වී එම ඉඩම් හිමියා මෙම පැමිණිලිකාර පාර්ශවය වෙත අලාභයක් ගෙවා ඇති බව පැවසූ බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ එම හානිය සිදුවී ඇත්තේ 2011 වර්ෂයේදී බවත්, සිදු වී ඇති අලාභයට රු.124,000ක් ගෙවා ඇති බවත්, සභාව මඟින් එම පස් කන්ද ඉවත් කරන ලෙස දැනුම් දී ඇති නමුත් මේ වන තෙක් එලෙස ඉවත් කිරීමක් සිදු කර නොමැති බවත්ය.ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් අදහස් දක්වමින් එම ස්ථානයේ ඉතාමත් අවධානම් තත්වයක් පවතින බවත්, වසර ගණනාවක් තිස්සේ කණු සිටුවා ඇති බවත් එම කණු සිටුවා ඇති පස් බුරුල් වී ඇති බවත්, පැමිණිලිකාර පාර්ශවය ඉල්ලා සිටින්නේ පස් කන්ද ඉවත් කරන ලෙස බවත්, කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදුකර මෙම පස් කන්ද ඉවත් කිරීමට ලිපි එම පස් කන්ද සහිත ඉඩම් හිමියා වෙත නිකුත් කර ඇති බවත්, නමුත් එම කාර්යය සිදු වී නොමැති බවත් පස් ඉවත් කිරීමට කටයුතු සිදු කරදෙන ලෙසත් පවසන ලදී.

ඒ අනුව ඉහත ස්ථානයේ අනාරක්ෂිත පස් කන්ද ඉවත් කිරීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සහ ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා පවසන ලදී.

❖ බළන්ගොඩ, ඕලුගංතොට වසමේ හොරකඳ ඇළ හරහා දමා තිබූ පාලම පසුගියදා ඇතිවූ වර්ෂාව හේතුවෙන් ඉතාමත් අවධානම් තත්වයට පත්ව ඇති බවත්, පාලම පුපුරා කැඩී ගොස් ඇති බවත්, පාලම් බැම්මද කැඩී ගොස් ඇති බවත්, මෙම අවධානම් තත්වයේ කඩා වැටීමට ආසන්න පාලම නැවත සාදා දෙන ලෙසත් දන්වමින් සෙලෝවත්ත,ඕලුගංතොට,බළන්ගොඩ

ලිපිනයේ පදිංචි ශිව රංජන් පවාසම් යන අය යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
ඒ අනුව ඉහත ගැටළුව ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා කළමණාකරණ අංශය වෙත යොමු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා පවසන ලදී.

**05.ටෙන්ඩර්පත් හා මිල ගණන් විවෘත කිරීම.**

මෙදිනට නියමිත ටෙන්ඩර්පත් විවෘත කිරීම සඳහා ගරු උපසභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු උපසභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරන ලදී.

අනතුරුව ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනු ලැබූ පහත සඳහන් තීරණ ගරු උපසභාපතිතුමන් විසින් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

**05.01** බළන්ගොඩ නගර සභාවට අයත් ටෙන්ඩර් දැන්වීම් පුවරු අංක 01 සිට අංක 10 දක්වා බදුදීමට සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කිරීම.

බළන්ගොඩ නගර සභාවට අයත් ටෙන්ඩර් දැන්වීම් පුවරු අංක 01 සිට අංක 10 දක්වා 2025.12.15 දින සිට 2026.12.14 දින දක්වා වර්ෂයක කාලයකට බදුදීමට සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර්පත් කැඳවීමේදී අයඳුම්පත් 02ක් නිකුත් වී තිබූ අතර පහත පරිදි ලංසු ඉදිරිපත් වී තිබූ තිබිණි.

| **දැන්වීම් පුවරු අංකය** | **ටෙන්ඩර්කරුගේ නම** | **ලංසු මුදල (රු.)** |
|---|---|---|
| අංක 04 | ජී.චමිලා ප්‍රියදර්ශනී<br>කසුන් ලක්මාල් | 4800.00<br>4500.00 |
| අංක 05 | ජී.චමිලා ප්‍රියදර්ශනී | 5000.00 |

ඒ අනුව ජී.චමිලා ප්‍රියදර්ශනී දැන්වීම් පුවරු අංක 04 සහ අංක 05 සඳහා පිළිවෙලින් වැඩිම ලංසු මුදල වූ රු.4800 සහ රු.5000 ක මුදල ඉදිරිපත් කර තිබූ අතර එම ලංසු මුදල පිළිගත් නිසා එම දැන්වීම් පුවරු 02 ජී.චමිලා ප්‍රියදර්ශනී යන අය වෙත පිරිනැමීමටත්, ඉතිරි ටෙන්ඩර් ඉදිරිපත් නොකරන ලද දැන්වීම් පුවරු 08ම එකවර තොගයක් ලෙස ටෙන්ඩර් කිරීමටත් ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

**05:02** මාර්ග නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය 80/100 තාර බැරල් 30ක් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් විවෘත කිරීම.

මාර්ග නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය 80/100 තාර බැරල් 30ක් මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවූ අතර ඒ සඳහා GKUC International සහ Road coating International (pvt)Ltd යන ආයතන දෙක මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.එම ආයතන ඉදිරිපත් කරන ලද මිල ගණන් අතුරින් තාර මිලදී ගැනීමට සුදුසු ආයතනය තෝරා ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කිරීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

ටෙන්ඩර් මණ්ඩලය විසින් ගන්නා ලද ඉහත ටෙන්ඩර් මණ්ඩල තීරණ ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කළ අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06. කල් දී ඇති ප්‍රශ්න**

**06:01 ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා.ඩී වීරසිංහ මැතිතුමිය**

**06:01:01** බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටියේ තත්වය කෙසේද?

ඉහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසූයේ නගර සභා ක්‍රීඩා පිටිය නඩත්තු කිරීම් කටයුතු දෛනිකව සිදු කරනු ලබන බවයි.

**06:01:02** බුලත්ගම සුසානභූමිය සම්බන්ධයෙන් වැඩකටයුතු කෙසේද?

ඉහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසූයේ බුලත්ගම සුසානභූමියේ ගේට්ටුව පිළිසකර කිරීම, තාප්පයක් ඉදිකිරීම හා අවධානම් තත්වයේ පවතින ගස් ඉවත් කිරීම යන නඩත්තු කටයුතු සිදු කරමින් පවතින බවත්, අනතුරුදායක ගස් 06ක අතු කැපීම වෙනුවෙන් මිල ගණන් කැඳවා ඇති බවත්ය.

**06:02 ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා**

**06:02:01** හිඟ හිටි වරිපනම් අයකර ගැනීම සඳහා සකස් කර ඇති වැඩ පිළිවෙළ ඉදිරිපත් කරන්න.

ඉහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පහත පරිදි පිළිතුරු ලබා දෙන ලදී.

හිඟ හිටි වරිපනම් අයකර ගැනීම සඳහා සකස් කර ඇති වැඩ පිළිවෙල

- නොගෙවන ලද වරිපනම් ඒකක හඳුනාගෙන පවත්නා හිඟියේ ප්‍රමාණය අනුව නගර සභා ආඥා පනතේ 170/2 වගන්තිය ප්‍රකාරව දේපළ තහනම් කටයුතු සිදු කිරීම.
- හිඟ වරිපනම් ඒකක හඹා යාම.

- වරිපනම් ජංගම සේවා පැවැත්වීම.(2024.12.31 දිනට හිඟව පවත්නා සහ 2025.12.31 දිනට ගෙවිය යුතු වරිපනම් අයකර ගැනීම සඳහා ගෙන් ගෙට යාමේ වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී.)
- ප්‍රචාරක කටයුතු සිදු කිරීම.
- දේපළ සමීක්ෂණය සිදු කිරීම.
- ක්ෂේත්‍ර නිලධාරීන්ට ආදායම් ඉලක්ක ලබා දී ලැබිය යුතු හිඟ මුදල් අයකර ගැනීම.

**06:02:02** දැනට සභාව විසින් වරිපනම් අයකිරීම සඳහා ලියාපදිංචි ඒකක සහ නමුත් සත්‍ය වශයෙන්ම වරිපනම් අයකළ යුතු ඒකක අතර වෙනස ඉදිරිපත් කරන්න.

සභාව විසින් 2025.12.03 දිනට වරිපනම් අයකරනු ලබන දේපල විස්තරය පහත පරිදි වේ.

| **දේපල විස්තරය** | **දේපල ප්‍රමාණය** |
|---|---|
| ව්‍යාපාරික ස්ථාන හා ඉඩම් | 5362 |
| නේවාසික ස්ථාන | 5704 |
| එකතුව | 11066 |

නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති සියළු දේපල ප්‍රමාණය පිළිබඳව සමීක්ෂණයක් සිදුකර ලබාගත් තොරතුරු නොමැති හෙයින් දැනට වරිපනම් අයකරන දේපල ප්‍රමාණය හා බල ප්‍රදේශයේ පිහිටා ඇති වරිපනම් අයකල යුතු සියළු දේපල අතර වෙනස ප්‍රකාශකල නොහැක.

ගරු නාගරික මන්ත්‍රී ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා, දේපල තහනම් කිරම් මේ වන විට කීයක් සිදු කර ඇත්ද යන්නත්, වරිපනම් අයකිරීමේදි මාසයේ අයකිරීම් සඳහා ඉලක්ක ලබා දීමක් සිදුවනවාද යන්නත් විමසන ලදි.ගරු සභාපතිතුමා පැවසුයේ අදාළ තොරතුරු ආදායම් අංශයෙන් ලබාගත හැකි බවයි.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පැවසුයේ අදහසක් ලෙස වරිපනම් සඳහා බිල්පත නිවෙස් හිමියන් වෙත ලබා දිමේදි නිවෙසියන් අතටම ලබාදීම පිළිබඳව නිලධාරින් දැනුවත් කරන ලෙසයි.

**06:02:03** 2026 වර්ෂයේ අයවැය යෝජනා සඳහා මන්ත්‍රීවරුන් ලබා දී ඇති යෝජනා හා භාහිර පාර්ශව ලබා දී ඇති යෝජනා අතරින් ඉතාමත් කාලෝචිත හා ප්‍රායෝගික යෝජනා ඇතුළත් සැලැස්මක් සකස් කර තිබේද? සභාවට ඉදිරිපත් කරන්න.

ඉහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසුයේ බාහිර පාර්ශව හා ගරු නාගරික මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කර ඇති 2026 අයවැය යෝජනා සඳහා කාලෝචිත ප්‍රමුඛතා ලේඛණයක් ගරු සභාව වෙතින් ලබා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

**06:03 ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා**

**06:03:01** බැංකියවත්ත කසළ අංගනයේ උප කාර්යාලය විවෘත කිරීම සම්බන්ධව තවමත් ක්‍රියාත්මක නොවීමට හේතුව සභාවට ඉදිරිපත් කරන්න.

උප කාර්යාලය විවෘත කර ඇති බව ගරු සභාපතිතුමා පැවසූ අතර ගරු නාගරික මන්ත්‍රී ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පැවසූයේ උප කාර්යාලයේ කටයුතු වෙනුවෙන් සුපරීක්ෂකවරයෙකු පත්කර ඇත්ද යන්නත්, ඒ සම්බන්ධව ලිපිලේඛන භාරදී ඇත්ද යන්නත්ය.මේ සම්බන්ධව මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගෙන් කරුණු විමසීම් කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

බැංකියවත්ත කසළ කළමණාකරණ මධ්‍යස්ථානයේ උප කාර්යාලය පිළිබඳව තොරතුරු මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගෙන් විමසීම් කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**06:03:02** බළන්ගොඩ නගර සභාව තොග පවත්වාගෙන යාමේදී අනුමගමනය කරන තොග පාලන ක්‍රමය කුමක්ද?2025.11.30 දිනට සියලුම තොග පාලන මට්ටම් වල ශේෂය දක්වන්න.

බළන්ගොඩ නගර සභාව තොග පවත්වාගෙන යාමේදී අනුමගමනය කරන තොග පාලන ක්‍රමය FIFO (First In First Out) වේ.සභාවේ අංශවල ඉල්ලීම් අනුව තොග ගබඩා කර ගන්නා අතර එම තොගවලින් 75%ක් නිකුත් කල විට අවශ්‍යතාවය මත නැවත ඇණවුම් කිරීම සිදු කරනු ලැබේ.සමහර ද්‍රව්‍ය නිකුත් කිරීමේදි අමතර ලේඛනයක් පවත්වා ගෙන අතර එම ද්‍රව්‍ය තොග පොතෙන් අඩු කරනු ලබන්නේ එම මාසයේ අවසානයේදීය.

කර්මාන්ත වැඩ සඳහා ගනුලබන ගල්,වැලි,සිමෙන්ති,තාර,කෝලාස්ට් ආදීයද කර්මාන්ත අංශයේ ඉල්ලීම මත තොග ලබාගන්නා අතර එම තොග වලද අවශ්‍යතාවය අනුව තොග ලබා ගැනීම කරනු ලැබේ.තොග පොත් 06ක් ඇති අතර එම සියලුම තොග වර්ග 400කට ආසන්න ප්‍රමාණයක් ඇති බැවින් එම එකිනෙක තොග ශේෂ ලබා දිමට මාස 02ක පමණ

කාලයක් වැය වේ.මෘදුකාංග පද්ධතියේ තොග මට්ටම් වල ශේෂය පෙන්වීමට නොහැකි බැවින් ගබඩාවට උචිත මෘදුකාංගයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය කාරණාවක් බවට පත්ව ඇත.

**06:03:03** 2025.11.30 දිනට බළන්ගොඩ නගර සභාව විසින් අනුමත කර ඇති ගොඩනැගිලි සැලසුම් ගණන කොපමණද? ඒවා මොනවාද යන්න සංක්ෂිප්ත වාර්තාවක් ඉදිරිපත් කරන්න.

2025.11.30 දිනට බළන්ගොඩ නගර සභාව වෙත ගොඩනැගිලි සැලසුම් 83ක් ලැබී ඇති බවත්, එයින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුම් ගණන 60ක් සහ ප්‍රතික්ෂේප කරන ලද ගොඩනැගිලි සැලසුම් ගණන 23 ක්ද වේ.

**06:03:04** E-Library හි කටයුතු කරන සංකල්ප මහතාගේ රැකියා විස්තරය( duty list) කුමක්ද?

ඉහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා E-Library හි කටයුතු කරන සංකල්ප මහතාගේ රැකියා විස්තරය ඉදිරිපත් කරන ලදි.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පැවසුයේ ගරු සභාපතිතුමා ඉදිරිපත් කළ එම මහතාගේ රැකියා විස්තරය අනුව ආයතනයේ නොමැති බවට ප්‍රකාශ කළ තොග පාලනය සම්බන්ධව මෘදුකාංගයක් නොමිලේ ලබාගෙන එය කළ හැකි බවත්, ආයතනයේ වෙබ් පිටුවක් සෑදීමටත්, ෆේස් බුක් ගිණුම යාවත්කාලීන කිරීමටද ඔහුට දැනුම ඇති බවත්, ඒ පවසන ආකාරයට ඔහුගේ දැනුම ඵලදායීව යොදාගෙන නොමැති බව පැහැදිලි වන බවත්ය.ගරු සභාපතිතුමා පැවසුයේ ඒ පිළිබඳ සොයා බලා කටයුතු කරන බවයි.

**06:04 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

**06:04:01** තත්කාලයේ ධූරයේ සිටින සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන පළමු සහ දෙවන අයවැය ලේඛණය සභාවේ සම්මත නොවුවහොත් සභාපතිවරයාගේ ධූරය සම්බන්ධයෙන් බලපෑමක් හෝ වෙනසක් සිදුවේද?

ඉහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසුයේ, 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන විශේෂ විධිවිධාන පනත අනුව නිල කාලය ආරම්භ වී වසර දෙකක් ගතවන තෙක් අයවැය ලේඛනය සම්මත වූවා සේ සලකා කටයුතු කිරීමට සභාපතිවරයාට බලය ඇති බවයි.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ මෙම ප්‍රශ්නය ඇසීමේදී තමාට ඒ පිළිබඳව අවබෝධයක් තිබූ බවත්, නමුත් මෙම ප්‍රශ්නය ඉදිරිපත් කලේ පසුගිය අයවැයේදී තමන් එයට පක්ෂව ඡන්දය ලබාදීමත් සමඟ තමන් ඡන්දය ලබා දුන් බැවින් බලය ලබා ගැනීමට බැරිවූ බව පවසමින් සමහර පිරිසක් සමාජයේ වැරදි ප්‍රචාරයක් යවා

ඇති බැවින් 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන විශේෂ විධිවිධාන පනත ප්‍රකාරව එම නීතිමය තත්වය පැහැදිලි කිරීම අරමුණ වූ බවත්ය.

**07. කල් දී ඇති යෝජනා**

**07:01 ගරු සභාපති කේ.ජී.ජේමදාස මැතිතුමා**

**07:01:01** නාගරික සංවර්ධන අධිකාරිය සතු 99 බස් නැවතුම්පොළ පිටුපස අක්කරයක පමණ ඉඩම රථගාලක් පවත්වාගෙන යාම වෙනුවෙන් බදු පදනම මත ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා මෙහිදී කරුණු පැහැදිලි කරමින් පැවසුයේ මෙම ඉල්ලීම දැනට නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමුකර ඇති බවත් තවම ඒ පිළිබඳ එකඟතා ලිපියක් ලැබී නොමැති බවත්, නාගරික සංවර්ධන අධිකාරියේ එකඟතාවය මත එකී ඉඩම බදු පදනම ලබා ගැනීමට හැකියාව ලැබුනහොත් නගරයේ තැන් තැන් වල පවතින බස් රථ එකම ස්ථානයකට ගැනීමේ හැකියාවක් ලැබෙන බවත්, ඒ අනුව එයින් ලැබෙන ආදායමෙන් ඉඩමේ බදු කුලිය ගෙවීමේ හැකියාව ලැබෙන බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:02** සභා කාර්යාලයේ ආරක්ෂක කටයුතු වෙනුවෙන් සිවිල් ආරක්ෂක බටයන් දෙදෙනෙකු බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ ගරු සභාපතිතුමන්ගේ යෝජනාව අනුව බඳවා ගන්නේ පැය 12ක සේවා මුරයක් සඳහා දෛනික වැටුප රු.1800ක වැටුපක් ගෙවානම් දිනකට රු.3600ක්ද මාසයක් සඳහා රු.108,000ක්ද වාර්ෂිකව රු.1,296,000ක්ද වැය කිරීමට සිදුවන බවත්, 2026 අයවැය මඟින් ඒ සඳහා මුදල් වෙන්කිරීමක් සිදුනොකර එවැනි මුදලක් වියදම් කිරීමේ හැකියාවක් පවතීද යන්නත්, දැනට ස්ථිර මුරකරුවන් තිදෙනෙකු පමණක් සිටියද කම්කරුවන්ගෙන් එම සේවාව ආවරණය කිරීමේ හැකියාවක් පවතින බවත්ය.

ගරු සභාපතිතුමා, ස්ථිර මුරකරුවන් 03දෙනෙකු පමණක් සිටින බැවින් අතිකාල දීමනා ගෙවීමට සිදුවීමේදී ඉහත මුදල හා සමාන මුදලක් ඒ වෙනුවෙන් වැය කිරීමට සිදු වන බවත්, කම්කරුවන්ගෙන් එම රාජකාරිය ආවරණය කිරීමේ හැකියාවක් පැවතියද එම ස්ථානයේ රැඳී සිටීමේ ගැටළු ආදිය ඇතිවන බව පැවසීය.එයට හේතුව වන්නේ ආයතනයේ අංශ ප්‍රධානීන්, අධීක්ෂණ නිලධාරින්ගෙන් අධීක්ෂණයක් සිදුනොවීම බව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසන ලදී.නමුත් කම්කරුවන් මඟින් එම කාර්යය සිදුනොවන බවත්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් සේවාව ලබා ගැනීමේදී එම ආරක්ෂක නිලධාරීන් ප්‍රමිතියකින් යුතු බවත් එම දෙපාර්තමේන්තුව සේවය පිළිබඳ වගකීමට බැඳෙන බවත් ගරු සභාපතිතුමා පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමාද පැවසුයේ ඉහත ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූ පරිදි ආරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා වැටුප් ගෙවීම වෙනුවෙන් 2026 අයවැය මඟින් වෙන්කිරීම් සිදු නොකර වැය දරන්නේ කෙසේද යන්න ගැටළුවක් බවයි.

එම වැටුප් ගෙවීමට වැය වන මුදල අතිකාල ගෙවීම මඟින් ආවරණය වන බවට වන ගරු සභාපතිතුමාගේ පිළිතුරෙන් පසු ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ ස්ථිර කම්කරුවන්ට අතිකාල ගෙවීම් කළද දෛනික වැටුප් ගෙවන කම්කරුවන් වෙත අතිකාල ගෙවීමක් සිදු නොකරන බවයි.ගරු සභාපතිතුමා පැවසුයේ මෙම කාරණාවේදී වැදගත්වන්නේ මුදල නොව මෙම ආයතනයේ රථ වාහන පවා විශාල ප්‍රමාණයක් පවතින බැවින් ආරක්ෂාව බවයි.මෙහිදී තමන් මෙම බඳවා ගැනීමට විරුද්ධව කතා කිරීමක් සිදු නොවන බවත් ගරු සභාපතිතුමා පවසන ආකාරයට ආයතනයේ සේවකයන්ගේ විනයක් නැතිබව මුලින්ම විධිමත් කළ යුතු බවත්, හුරුවීමකට ඉඩ නොදී හුරුවී ඇති රටාව වෙනස් කළ යුතු බවත් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා වැඩිදුරටත් කරුණු දක්වමින් පැවසිය.

ගරු සභාපතිතුමා පැවසුයේ කම්කරුවන් මුර සේවයේ යෙදවීම තුළ ක්ෂේත්‍රයේ රාජකාරී අඛණ්ඩව පවත්වා ගැනීමේ ගැටළු මතුව ඇති බවත්, කම්කරුවන් වෙනත් රාජකාරී වල යෙදවීම තුළ අත්‍යාවශ්‍ය දෛනික කටයුතු අඩාල වන බවත්, එබැවින් මෙම තීරණය ගැනීම වඩාත් සුදුසු බවන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:03** බළන්ගොඩ නගරයේ තුරු උයන පරිශ්‍රයේ හෙළ බොජුන්හලක් ඉදිකිරීම සඳහා ඉඩම ලබා ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියෙන් එකඟතාවය ලබා ගැනීම වෙනුවෙන් සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:04** බළන්ගොඩ තුඹගොඩ සාංඝිකාරාමයේ රථ ගාලක් ස්ථාපිත කිරීම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සාංඝිකාරාමයේ ස්වාමීන් වහන්සේ මේ සඳහා අවසර ලබා දී ඇත්ද යන්නත්, පන්සලට යම් මුදලක් ගෙවිය යුතුද යන්නත් විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසූයේ නායක ස්වාමීන් වහන්සේ මේ සම්බන්ධව එකඟතාව පල කර ඇති බවත්, මුදලක් ගෙවිය යුතු බවත්ය.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා මේ සම්බන්ධව ගිවිසුම්ගත වී සිදු කරනවාද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසූයේ සභාවෙන් සිදුකරනවාද පන්සලෙන් සිදුකරනවාද යන්න පිළිබඳව සාකච්චා කර තීරණයක් ගත යුතු බවත්, සිදුවිය යුත්තේ තුඹගොඩ පවතින අධික රථවාහන තදබදය ගැටළුවට පිළියමක් යෙදීම බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා පැවසූයේ මෙම භූමිය සභාව සතු භූමියක් නොවන බැවින් බදු ගැනීමක් කිරීමට සිදු වන බවත්,සභාවෙන් සිදුකරනවාද නැතිනම් ටෙන්ඩර් කරනවාද යන්න ආදිය තීරණය කළ යුතු බවත්ය.

ගරු සභාපතිතුමා පැවසූයේ පන්සලටද කිසිඳු ආදායම් මාර්ගයක් නොමැති බැවින් ගරු ස්වාමීන් වහන්සේ වෙත මෙම යෝජනාව ඉදිරිපත් කිරීමේදී එයට එකඟවූ බවයි.එසේනම් කල යුත්තේ පන්සලේ රථ ගාලක් පවත්වා ගෙන යාමට සභාවේ කිසිඳු විරුද්ධත්වයක් නොමැති බව දන්වා ඒ සඳහා අවසර ලබාදීම බව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා අදහස් දක්වමින්, ගරු සභාපතිතුමා මෙම යෝජනාව ඉදිරිපත් කර ඇත්තේ පන්සලට සහ සභාවට යන දෙපාර්ශවයටම ආදායමක් ලැබෙන පරිදිනම් කළ යුත්තේ මීට අදාළව ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ඊට අදාළව ගරු ස්වාමීන් වහන්සේ සමඟ සාකච්ඡා කර එකඟතාවයකට පැමිණිය යුතු බවත්,ඉන් පසුව එම ව්‍යාපෘති වාර්තාව සභාවට හෝ මුදල් කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු බවත්, එසේ සිදුකිරීමෙන් මෙය සාර්ථකව සිදුකළ හැකි බවත්, මෙය ඉතා හොඳ යෝජනාවක් බවත් පවසන ලදී.

පන්සලේ භූමිය බදුගැනීම හෝ දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමක් සකස් කර ගත යුතු බව ගරු නාගරික මන්ත්‍රී නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසීය.ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ වර්ෂ ගණනාවක් තිස්සේ ගරු සුනේත්‍රා මන්ත්‍රීතුමියගේ තුඹගොඩ මඟී ආවරණයක් ඉදිකිරීම සඳහා යෝජනාවක් පැවති බවත්, මේ සමඟම එම යෝජනාව පිළිබඳවද සලකා බැලීමක් සිදු කරන ලෙසත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ එම මඟී ආවරණය පිළිබඳ යෝජනාව සඳහා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාද මැදිහත්වූ බවත්, එම ස්ථානයට මඟී ආවරණයක් අත්‍යවශ්‍ය බවත්, ස්වාමීන් වහන්සේ යෝජනා කළ ස්ථානයේ එය ඉදිකිරීමේ හැකියාවක් නොමැති බැවින් ඒ පිළිබඳ ස්ථානයක් සඳහා ගරු ස්වාමීන් වහන්සේගේ එකඟතාවය ලබා ගැනීම කළ යුතු බවත්ය. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පැවසුයේ වසන්ත සභාපතිතුමාගේ කාලයේ මඟී ආවරණය ඉදිකිරීමට අනුමැතිය ලබා ගැනීමේ පොරොන්දුව මත පන්සල අසල විශාල මුදලක් වැය කර කාණු පද්ධතියක් ඉදිකළ බවත්, නමුත් කෙසේ හෝ එම අවස්ථාවේදීද එය මඟහැරුන බවත්ය.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේ එම ස්ථානයේ අධිබලැති විදුලි රැහැන් පද්ධතියක් පවතින බැවින් ඒ පිළිබඳවද සැලකිලිමත් විය යුතු බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත බළන්ගොඩ තුඹගොඩ සාංඝිකාරාමයේ රථ ගාලක් ස්ථාපිත කිරීමේ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:05** බළන්ගොඩ කිවුලවෙල ජනතාවට ඉඩම් අයිතිය ලබා දීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව පසුගියවර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහාද ඉදිරිපත් වූ බවත්, එහිදී සභාවේ එකඟතාවය ලබා දෙන ලෙස උපදෙස් ලබාදුන් බවත් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසන ලදී.ගරු සභාපතිතුමා පැවසුයේ සභාවේ එකඟත්වය ඒ වෙනුවෙන් ලබා දිය යුතු බැවින් ඉදිරිපත් කළ බවයි.වැඩිදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ එම ඉඩම් ලේඛනගත වී ඇත්තේ සභාව සතු ඉඩම් ලෙස බවත්, එම ලේඛණගතවීම බැහැරකරන ලෙස ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලීම් කළයුතු බවත්, දැනට එම ස්ථානයේ නායගොස් ගෙයක් හානී වී ඇති පුද්ගලයෙකුටද ඉඩම් අයිතිය නොමැති බැවින් වන්දි නොලැබෙන බවත් එබැවින් ඉහත යෝජනාවට අදාළ  කාර්යය කඩිනමින් සිදුකළ යුතු බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ජී.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී මොහාන් සාලිය එල්ලාවල මාවතේ නායයෑමට  පිළියමක්

ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය හරහා ආරක්ෂිත පැති බැම්මක් ඉදිකිරිමේ යෝජනාව සඳහා සභා අනුමැතිය ලබා ගෙන එවන ලෙස දැනුම් දුන් බවත්, ඒ අනුව ඒ සඳහා අනුමැතිය අවශ්‍ය බවත්ය.

ඒ අනුව මොහාන් සාලිය එල්ලාවල මාවතේ නායයන ස්ථානයේ ආරක්ෂිත පැති බැම්මක් ඉදි කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දැනුම්දීමට එකඟතාවය පළ කරන බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කිරීමට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:06** අක්කර 18,එච්.එම් රංජිත් බෝගොඩ යන අය ගලි බවුසරය ලබා ගැනීම සඳහා 2024-12-05 වන දින රු.17,000ක මුදලක් ගෙවන ලදුව අදාළ ස්ථානයට ගලි බවුසරය යාමේදී වර්ෂාව හේතුවෙන් එරීමට ලක්වී අපහසුවෙන් ගොඩ ගෙන ඇත.මෙම මහතා ගෙවූ මුදල් ආපසු ගෙවීමට යාමේදී ප්‍රවාහන ගාස්තුව අඩු නොකරන ලෙස 2025.11.14 දිනැති ලිපියෙන් දන්වා ඇති අතර ප්‍රවාහන ගාස්තුව රු.2000කි. මෙහිදී ප්‍රවාහන ගාස්තුව අයකිරීම පිළිබඳව සභාවේ තීරණය කිරීම සහ මුදල ආදායමට බැරවී ඇති බැවින් ආපසු ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මින් පෙර නම් නගර සභා සීමාවේ වූ විට ප්‍රවාහන ගාස්තුව අය නොකරන බවත් ඒ අනුව මෙහිදී ප්‍රවාහන ගාස්තුව අයකිරීමක් කිරීමේ හැකියාවක් නොමැති බවත්, ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පවසන ලදී.ඒ අනුව ගරු සභාපතිතුමා පැවසූයේ සභාව ප්‍රවාහන ගාස්තුව අයකිරීමට එකඟතාවය ලබා නොදෙන්නේ නම් එය අඩු නොකර ලබා දිය හැකි බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත ගලි තැන්පතුවෙන් මුළු මුදලම නිදහස් කිරීමට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:07** බළන්ගොඩ මහජන පොළ සහ බස් නැවතුම්පොළ පොදු වැසිකිළි ටෙන්ඩර් ඇප තැන්පත් මුදල් රු.516,000 මුදල ටෙන්ඩර් ගිවිසුම අනුව අඩුකිරීමට ඇති මුදල් ඇතොත් අඩුකර බදුකරු වන ආර්.කේ ජයසුන්දර මහතා වෙත ආපසු ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:08** 2025-11-01 දින සිට 2026-10-31 දින දක්වා බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීමේ ටෙන්ඩරය ක්‍රියාත්මක වන බැවින් ටෙන්ඩර්කරු වෙත මහ සභාවේ අනුමැතියට යටත්ව මාසිකව රු.1,250,000.00 මුදල් ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:09** 2025-11-01 සිට 2025-11-30 දින දක්වා බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීමේ ටෙන්ඩර්කරු වෙත රු.1,250,000ක් ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:10** 2025-10-01 සිට 2025-10-31 දින දක්වා බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීමේ ටෙන්ඩර්කරු වෙත රු.1,050,000ක් ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය**

**07:01:11** ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරුව්‍යවස්ථාව සහ දැන්වීම් පුවරු වෙනත් තාවකාලික නිර්මාණ හා සැරසිලි කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම සම්බන්ධව නව නිර්දේශ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් යොමුකර ඇත. එබැවින් දැනට

පවතින අතුරු ව්‍යවස්ථාව වෙනස්විය යුතුද යන්න සහ ඊට අදාළව ඉටුවිය යුතු කරුණු පිළිබඳව තීරණය කිරීම සඳහා කමිටුවක් පත්කිරීමට අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ලේකම්තුමියගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කෙරිනි.

ඒ අනුව ඉහත කමිටුවේ සාමාජිකත්වය සඳහා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

කමිටුවේ සාමාජිකත්වය සඳහා ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස්.චන්දන මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

කමිටුවේ සාමාජිකත්වය සඳහා ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී  එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

කමිටුවේ සාමාජිකත්වය සඳහා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා සුදුසු බවට ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී  ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

කමිටුවේ සාමාජිකත්වය සඳහා ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා.ඩී වීරසිංහ මැතිතුමිය යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී  ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරුව්‍යවස්ථාව සහ දැන්වීම් පුවරු වෙනත් තාවකාලික නිර්මාණ හා සැරසිලි කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම සම්බන්ධව කටයුතු කිරීමට අදාළ කමිටු සමාජිකයන් ලෙස පහත ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා පත් කරන ලදී.

01.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා

02.ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස්.චන්දන මැතිතුමා

03.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා

04.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා

05.ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත කමිටු සාමාජිකයන් පත් කිරීම ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:12** ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරිය යටතේ පාඨමාලාව හදාරන පහත නම් සඳහන් ශිෂ්‍යාවන් බළන්ගොඩ නගර සභා පෙර පාසලේ මාස 06ක පුහුණුවක් ඉල්ලුම් කරන බැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

1.ඩබ්.රසිකා අනුරාධා

2.පී.නයෝමිකා සෙව්වන්දි

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:13** 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබාදෙන රු.75,000 ප්‍රතිපාදන යටතේ සෝලා වීථි ලාම්පු ආධාරක සහිතව ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:14** සභාව සතු වාහන 2026 වර්ෂය සඳහා රක්ෂණය කිරීම වෙනුවෙන් තක්සේරුකරුවෙකු ලවා තක්සේරු කර ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන්, මෙම තක්සේරු කර ගැනීම වෙනුවෙන් රජයේ තක්සේරු නිලධාරින් සම්බන්ධ කර ගැනීමට උත්සහ කළද ඔවුන් ඉතා කාර්යබහුල බැවින් සම්බන්ධ කර ගැනීමට අපහසු වූ බවත්, එබැවින් පෞද්ගලික ආයතනවල තක්සේරු නිලධාරිවරයෙකු

ලවා තක්සේරු කර ගැනීමට හැකියාව පවතින බවත්,කෙසේ පැමිණියද ගෙවීම් සිදු කිරීමට සිදු වන බවත් පැවසීය.

අනතුරුව ගරු සභාපතිතුමන් සභාව සතු වාහන 2026 වර්ෂය සඳහා රක්ෂණය කිරීම වෙනුවෙන් පෞද්ගලික තක්සේරුකරුවෙකු ලවා තක්සේරු කර ගැනීමට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:15** 2025 වර්ෂය සඳහා බලංගොඩ නගර සභාවේ ප්‍රධාන කාර්යාලය, ගබඩාව, නගර සභා පෙරපාසල, ආයුර්වේදය, ක්‍රීඩාගාරය, බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතිය, තානායම, විදුණැන පියස, සම්පත් පියස, ලේකම් නිල නිවස, වැවවත්ත හා බෝම්බුව පෙර පාසල, මහජන පුස්තකාලය , කියවීම් ශාලාව යන අංශවලට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීමට හා සමීක්ෂණ මණ්ඩලයට පහත නිලධාරීන් පත්කිරීමට සහ භාණ්ඩ සමීක්ෂණය අධීක්ෂණය සඳහා ගරු මන්ත්‍රීතුමන්ලා දෙදෙනෙකු පත් කිරීමට අනුමැතිය ලබා ගැනීම.

01.සභාපති - එම්. ජී. එස්. ගුණවර්ධන - ගණකාධිකාරී

02.සාමාජික - රජිත කොස්වත්ත

03.සාමාජික - භාග්‍යා අතපත්තු

04.සාමාජික - අමල් ප්‍රියංකර

05.සාමාජික - ඒ. ඩී. සී. එස්. කුමාර

06.සාමාජික - එච්. ඩී. දීපානී

07.සාමාජික - උමුදුනී විදානපතිරණ

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

භාණ්ඩ සමීක්ෂණය අධීක්ෂණය සඳහා ගරු උප සභාපතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බණ්ඩාර මැතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ කරුණු පැහැදිලි කර ගැනිම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

ගණකාධිකාරිතුමියගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:16** 2026 වර්ෂය සඳහා පහත නම් සඳහන් සේවකයින් හට සේවා ගිවිසුම් සකස් කර ගිවිසුම් අලුත් කිරීම හා සේවයේ යොදවා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| අනු අංකය | නම | අංශය |
|---|---|---|
| 01 | පී.ආර්.ශ්‍යාමා | සෞඛ්‍ය |
| 02 | යූ.ආර්.ලාල් ගුණරත්න | සෞඛ්‍ය |
| 03 | එන්.හේමන්ති | සෞඛ්‍ය |
| 04 | කේ.ජී.කුසුමලතා | සෞඛ්‍ය |
| 05 | කේ.ජී.නිල්මිණි ජයරත්න | සෞඛ්‍ය |
| 06 | යූ.ඩී.සුගත් කුමාර | සෞඛ්‍ය |
| 07 | ඩී.ටී.සන්ධ්‍යානි | සෞඛ්‍ය |
| 08 | එම්.රොෂාන් ප්‍රනාන්දු | සෞඛ්‍ය |
| 09 | ආර්.එම්.වී.පී.රත්නායක | සෞඛ්‍ය |
| 10 | එම්.එස්.ඒ.ඉන්ද්‍රසිරි | සෞඛ්‍ය |
| 11 | වයි.ඩබ්.එස්.එස්.කුමාර | සෞඛ්‍ය |
| 12 | කේ.ඒ.සී.එල්.බණ්ඩාර | සෞඛ්‍ය |
| 13 | ඒ.එම්.ඒ.ප්‍රියශාන්ත | කර්මාන්ත |
| 14 | යූ.එම්.උපාලි මුණසිංහ | කර්මාන්ත |
| 15 | ඩී. ජේ. උපුල් ශාන්ත විලේගොඩ | කර්මාන්ත |
| 16 | එච්. කරුණාරත්න | කර්මාන්ත |

| අනු අංකය | නම | අංශය |
|---|---|---|
| 17 | කේ. වී. චමරි හේමමාලා | සෞඛ්‍ය |
| 18 | කේ. කේ. නිවංකා කුසුම්සිරි | සෞඛ්‍ය |
| 19 | ඩබ්. බී. ප්‍රේමලතා | සෞඛ්‍ය |
| 20 | ඒ. තමිල් සෙල්වි | පෙරපාසල් |
| 21 | ඩබ්. එල්. චන්ද්‍රසිරි තිලකරත්න | සුසානභූමි |
| 22 | ආර්. කේ. සනත් ගුණතිලක | සෞඛ්‍ය |
| 23 | පී. ඩී. රණසිංහ බණ්ඩාර | කර්මාන්ත |
| 24 | කේ. ප්‍රියන්ත සුමිත් කුමාර | සෞඛ්‍ය |
| 25 | මධුෂානි ලක්ෂිකා අල්පොන්සස් මධුෂාණි | සෞඛ්‍ය |
| 26 | ආර් . කේ. ලසන්ත ගුණසේකර | සෞඛ්‍ය |
| 27 | ආර්. මංගලේෂ්වරී | පෙරපාසල් |
| 28 | බී. නදීශා ගුණතිලක | සෞඛ්‍ය |
| 29 | ආර්. කේ. ඩී. නිලන්ති | සෞඛ්‍ය |
| 30 | එච්. එච්. උජිත ලක්ෂාන් | සෞඛ්‍ය |
| 31 | බී. ලක්ෂ්මි ගුණරත්න | සෞඛ්‍ය |
| 32 | ඕෂණි ප්‍රියංගිකා ප්‍රියදර්ශනී | සෞඛ්‍ය |
| 33 | ආර්. කේ. අමිත් ප්‍රේමසිරි | සෞඛ්‍ය |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා ඉහත ගිවිසුම් ගත වන්නේ දෛනික වැටුප් මත සිටින සේවකයන්දැයි විමසන ලදුව ගරු සභාපතිතුමන් පැවසුයේ ස්ථිර පත්වීම් නොලද සේවකයන් අන්තර්ගත බවයි.ගරු නාගරික මන්ත්‍රීනි පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය, මෙම සේවකයන් මීට කලින් සිටියේ මෙලෙසමද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමන් පැවසුයේ සේවා ගිවිසුම් අලුත්කරමින් ඔවුන් සේවයේ යොදවා ඇති බවයි.

ගරු නාගරික මන්ත්‍රීනි පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පැවසුයේ රොෂාන් ප්‍රනාන්දු යන රියදුරා දිගටම සේවයේ යෙදී ඇති බවයි.ගරු සභාපතිතුමා පැවසුයේ එවැනි සේවකයන් කිහිප දෙනෙකු සිටින බවයි.ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා පැවසුයේ අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ගත නොහැකිව රාජකාරියේ යෙදෙන තනතුරේ ස්ථිර පත්වීම් ලබා ගත නොහැකි සේවකයන් කිහිපදෙනෙකු වසර ගණනාවක් තිස්සේ සිටින බවයි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ ඉහත ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා පැවසූ පරිදි එම සේවකයන් රියදුරු තනතුරේ ස්ථිර කිරීමට නොහැකිව ඇත්තේ අවම අධ්‍යාපන සුදුසුකම් නොමැතිකම හේතුවෙන් බැවින් මෙම අවස්ථාවේදී වෘත්තීය අධ්‍යාපනයක් වෙත යොමුකර අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම දක්වා සුදුසුකම් ලබාදීමෙන් පසු එම සේවකයන් ස්ථිර කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට යෝජනා කරන බවයි.ගරු සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය එකී යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් පැවසුයේ පුද්ගලිකවමද ඉහත යෝජනාව ඉදිරිපත් කළ බවත්, එහිදී NVQ LEVEL IV සහතිකය ලබා ගත යුතු බව දැන්වූ බැවින් මේ වන විට රියදුරන් යම් ප්‍රමාණයක් එම සහතිකය ලබාගෙන ඇති බවත්,නමුත් සෞඛ්‍ය කම්කරු සේවයේ සිටින සේවකයන් රියදුරු සේවයේ ස්ථිර කිරීමේ හැකියාවක් නොමැති බවට දන්වා ඇති බවත්, තවදුරටත් මේ පිළිබඳ තොරතුරු සොයා බැලීමට කටයුතු කරන බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ ජානක වක්කුඹුර මැතිතුමා පළාත් පාලන රාජ්‍ය අමාත්‍ය ලෙස සිටින කාලයේ මේ පිළිබඳ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා බළන්ගොඩ නගර සභාව වෙත ගෙන්වා සාකච්ඡා කළ බවත්, එහිදී 06 වසරට උඩින් සමත් වූ අයට විශේෂ කැබිනට් අනුමැතියක් ලබා ගත යුතු බව සඳහන් කළ බවත්, එහිදී අවසානය දක්වාම ක්‍රියාකළ බවත්, එම ලියවිලි

සියල්ල සභාවේ පවතින බවත්, මේ පිළිබඳ අනුමැතියක් ලබා ගැනීමට ඉතා මහන්සි වූ බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් එම රියදුරන් වෙත ස්ථිර පත්වීම් ලබා ගැනීමට නොහැකිව ඇත්තේ ඔවුන්ට අවශ්‍ය අවම සුදුසුකම නොමැති නිසාවෙන් බවත්,එබැවින් එසේ අධ්‍යාපන සුදුසුකම් නොමැති සේවකයන් වෙත පෙර සඳහන් කළ පරිදි එම සුදුසුකම සම්පූර්ණ වන පරිදි NVQ LEVEL IV සහතිකය ලබා ගැනීම වෙනුවෙන් යොමු කිරීම සුදුසු බවත් පැවසීය.ගරු සභාපතිතුමන් පැවසුයේ එම සහතිකය ලබා ගැනීම වෙනුවෙන් කිහිපදෙනෙකු යොමු කර ඇති බවයි.

පළාත් සභාවෙන් ක්‍රියාත්මක වන එම වෘත්තීය පුහුණුව වෙත අදාළ සේවකයන් යොමුකර සහතිකය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසීය.ගරු සභාපතිතුමන් පැවසුයේ එම සේවකයන් වෙත සාධාරණයක් ඉටුකරදීමට අවශ්‍ය පියවර ගන්නා බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:17** බලන්ගොඩ නගර සභාවට අයත් සාප්පු කඩ අංක 02 දරණ කඩ කාමරය 2007 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වාර්ෂික බදු ගිවිසුම අත්සන් කර කඩ කුලිය ගෙවනු ලැබුවේ එම්.එස්.එම්. මුදම්මිල් මහතා විසිනි. නමුත් එම මහතා 2025.02.26 වන දින ඔහු මියගොස් ඇති බව 2025.11.20 දින සභාවට දන්වා ඇත.

ඔහුගේ කලත්‍රයා සහ දරුවන් දෙදනා විසින් මෙම කඩ කාමර අංක 02 සඳහා වාර්ෂික ගිවිසුම් අත්සන් කිරීමට තමන්ට ලබාදෙන ලෙස ඉල්ලමින් ලිපියක් යොමුකර ඇත. සාප්පු කඩ කාමර දීර්ඝ කාලීනව ටෙන්ඩර් මගින් ලබා දී ඇති කඩ කාමර නොවන අතර ආරම්භයේ පටන්ම වාර්ෂිකව ගිවිසුම්ගත වී ඇති කඩ කාමර වේ. 2023.08.09 දින නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 1/2023 අනුව, බදු පදනම මත කඩ කාමර ලබාදීමේදී එහි වගන්ති 8.9 යටතේ ඇති (ඇ) උප වගන්තිය යටතේ ගිවිසුම් බදු කාලසීමාව තුළ බදු ගැනුම්කරු මියයන අවස්ථාවක දී ඉතිරිවන බදු කාල සීමාව සඳහා පමණක් උරුමය පිළිගනු ලබන ආකාරය දක්වා ඇත.

ඒ අනුව බදු කාල සීමාව අවසානයේ කලත්‍රයා සහ දරුවන් විසින් ඔවුන්ගේ නමින් බදු අයිතිය ඉල්ලා සිටින බැවින්ද ඉහත චක්‍රලේඛ ප්‍රකාරව එය සිදු කල නොහැකි බැවින්ද ඉදිරි කටයුතු තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ වාර්ෂික ගිවිසුම් අත්සන් කරනු ලබන කඩ කාමර දීර්ඝකාලීන බදු පදනම මත ලබා දීමට අදාළ අනුමැතිය වෙත යොමුකර ඇති බැවින් එකී අනුමැතිය ලැබෙන තෙක් ඉහත සාප්පු කඩ අංක 02 දරණ කඩ කාමරය සඳහා ගිවිසුම්ගතවීමට සභාවේ එකඟත්වය ලබා දිය හැකි බවයි.

මීට අදාළව ලේකම්තුමියගෙන් කරුණු පැහැදිලි කර ගැනීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්විය. අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් පසු ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්විය.

ඒ අනුව කාරක සභාවේ සාකච්ඡා කරගත් කරුණු අනුව වාර්ෂික ගිවිසුම් අත්සන් කරනු ලබන කඩ කාමර සඳහා දීර්ඝකාලීන බදු පදනම මත ගිවිසුම්ගතවීමට හැකියාව ඇති කඩ හිමියන් සමඟ ගිවිසුම්ගතවීමේ කටයුතු සිදුකිරීම සුදුසු බවට ගරු සභාවේ තීරණය විය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත සාප්පු කඩ අංක 02 සඳහා උරුමක්කරු සමඟ ගිවිසුම්ගතවීමට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:18** බළන්ගොඩ නගරයේ නව පදික කඩ අංක 197/26 නව පදික කඩ කාමරය ටී.ආර්.කේ මංජුලා මිය විසින් කුළියට ඉල්ලා සිටී.මෙම කඩ කාමරය මීන් පෙර ද ටී.ආර්.මංජුලා මහත්මිය ව්‍යාපාරික කටයුතු සිදු කර ඇත.ඒ අනුව ඇය විසින්,

2020.08.17 - පදික කඩ කාමරයට කී මනි ගෙවීම-රු.140,000.00 කර ඇත.

2020.08.17- 2020.08.17 සිට 2020.12.31 දක්වා ගිවිසුම අත්සන් කිරීම මාසික කුලිය-රු.1500.00

2020.12.31- 2021.01.01 සිට 2021.12.31 දක්වා ගිවිසුම අත්සන් කිරීම මාසික කුලිය-රු.1500.00

2021.12.31- 2022.01.01 සිට 2022.12.31 දක්වා ගිවිසුම අත්සන් කිරීම මාසික කුලිය-රු.1500.00

2023.06.15- 2023.05.01 සිට 2023.12.31 දක්වා ගිවිසුම අත්සන් කිරීම මාසික කුලිය-රු.4500.00

කඩ කුලිය 2023 ජුනි මස දක්වා ගෙවා ඇත.එබැවින් 2023.10.08 දින කඩ කාමරය නගර සභාව විසින් පවරා ගෙන ඇත.හිඟ කඩ කුලිය වන රු 13,500 ඇප තැන්පතුවෙන් සභාවට 2024.02.01 හිලවු කර ගෙන ඇත. වර්තමාන තත්වය ලෙස මෙම කඩ කාමරය සභාවට පවරා ගෙන වසා තබා ඇත.ආර්.කේ.මංජුලා මිය නැවත 197/26 කඩ කාමරය ව්‍යාපාරික කටයුතු සඳහා ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති හෙයින් ඉදිරි කටයුතු තීරණය කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා මෙහිදී අදහස් දක්වමින් පවසා සිටියේ මෙහි පවතින නීත්‍යානුකූල තත්වය අනුව මෙම කඩ කාමර සභාව වෙත පවරාගෙන ඇති බැවින් ටෙන්ඩර් කළ යුතු බවයි.

අනතුරුව මෙහිදී අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ, 01/2023 චක්‍රලේඛනය ප්‍රකාරව මෙම කඩ කාමරය සභාව වෙත පවරා ගෙන ටෙන්ඩර් කළ යුතු බවත්, කලිනුත් මතුකරේ මෙම කාරණාවම බවත්, එසේ නොමැතිව සභාව සතු දේපලක් දෙන්නේ නම් ආණ්ඩුකාරතුමියගේ විශේෂ අවසරය ලබා ගත යුතු බවත්, මෙම කාරණාව ලොකු ප්‍රශ්නයක් වී ගුටිකන්නත් සිදුවූ බවත්, නියමිත ක්‍රමවේදයටම යා යුතු බවත්, එසේ නොමැති නම් අන්තිමට සභාවට වගකීමට සිදු වනු ඇති බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ නියමිත ක්‍රමවේදයටම යා යුතු බැවින් ටෙන්ඩර් ක්‍රමවේදය අනුගමනය කරමින් ටෙන්ඩර් කිරීමට සිදුවන බවයි.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ කඩ කාමරය හිමිකරු පිළිබඳ නොදන්නා බවත්, නමුත් එම කඩහිමියාගෙන් තැන්පතුවක් ලබාගෙන ඇති බවත්,සභාව වෙත පවරාගෙන ටෙන්ඩර් කරනු ලබන්නේ සභාව වියදම් කර ඉදිකර ඇති කඩ බවත්, ඒ අනුව එම කඩ හිමියාගේ තැන්පත් මුදලද ඔහුට අහිමි වනු ඇති බවත්ය.ගරු සභාපතිතුමා පැවසුයේ තැන්පත් මුදල ඔවුනට ගෙවීමේ හැකියාවක් නොමැති බවයි.

එම කඩ කාමරයේ ගිවිසුමේ කොන්දේසි පරීක්ෂා කර ඒ අනුව කටයුතු කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසිය.ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පැවසුයේ එම ප්‍රදේශය දියුණු වීමට පෙර එම ස්ථානයේ කඩ ඉදිකළ බවත්, නමුත් දැන් බස් නැවතුම්පොළ ප්‍රදේශය ව්‍යාපාර සඳහා දියුණු ප්‍රදේශයක් වී ඇති බවත්, ඒ අනුව දැන් ටෙන්ඩර් කළහොත් එය වැඩිමිලකට ටෙන්ඩර් වනු ඇති බවත්, නමුත් කඩ හිමියා තැන්පත් මුදලක්ද ගෙවා කඩ කාමරය ලබාගෙන ඇති බැවින් ඔහුට අසාධාරණයක් වනු ඇති බවත්, ආපසු ඔවුන්ට පදික වෙළඳාමම සිදුකිරීමට සිදුවන බවත්, එම අහිංසක දුප්පත් මිනිසුන් වෙනුවෙන් සාධාරණයක් සිදු කල යුතු බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ මෙම කඩ කාමර ඉදිකරන ලද්දේ පදික වෙළඳුන්ට ලබා දීමට බැවින්,ටෙන්ඩර් ක්‍රියාවලියකට ගියහොත් වෙනත් පාර්ශවයක් එම කඩ කාමරය ලබාගනු ඇති බවත්, ඒ අනුව එම ඉල්ලීම කර ඇති කඩ හිමියාටම කඩ කාමරය ලබා දීම හෝ නොදීම සම්බන්ධව තීරණයක් ගන්නා ලෙස පවසන ලදී.තවත් මෙවැනිම කඩ කාමරයක් පවතින බැවින් ඒ ආකාරයෙන් හිස්වන කඩ කාමර වලට තීරණයක් ගත යුතු බවත් එතුමා වැඩිදුරටත් පැවසීය.

මෙහිදී කරුණු සාකච්ඡා කර ගැනීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අනතුරුව කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

කාරක සභාවේ සාකච්ඡා කරගත් කරුණු අනුව නව පදික කඩ කාමර අංක 197/26 පිළිබඳ සමීක්ෂණයක් සිදුකර පවතින නීතිමය තත්වය පිළිබඳවද අධ්‍යයනයක් සිදුකර ඊළඟ සභාවට වාර්තා කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා පවසන ලදී.

**07:01:19** 2025 ඔක්තොම්බර් මස දෛනික වැටුප් රු.1,629,774.98 ක් ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් පළාත් සභාවේ පැවැත්වූ පුහුණු වැඩසටහනනදී වංචා දූෂණ වැළැක්වීමේ පනත පිළිබඳව අවබෝධයක් ලබා දුන් බවත්, ඒ අනුව වරදක් දැනගෙන ඒ සම්බන්ධව දැනුවත් කිරීමක් නොකලේ නම් එයද වරදක් වන බවත්, පසුගිය මස දක්වාම ලක්ෂ 14ක පමණ මුදලක් දෛනික වැටුප් ගෙවීම වෙනුවෙන් වැයකළ බවත්, එහිදී ස්ථිර සේවකයන් සිටියදී දෛනික වැටුප් ගෙවීම වෙනුවෙන් විශාල මුදලක් දැරීම අධිභාරයක් වන බව පුන පුනා ප්‍රකාශ කළ බවත්, එම අදාළ තනතුරු වල පිහිටුවීම පිළිබඳ වගකීම පවතින්නේ පරිපාලනයට බවත්, ස්ථිර සේවකයන් සිටියදී මෙම යෝජනාවට අනුමැතිය ලබා දිය නොහැකි බවත්,

එම සේවකයන් වෙනත් සේවා ස්ථානවලට ස්ථාන මාරු කරගත්තානම් මෙම ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ නොසිටින බැවින් පිටින් මිලදී ගැනීමේ හැකියාව පවතින බවත්, කුඩා මුදලක් නොව විශාල මුදලක් බැවින් ගෙවීමට අනුමැතිය ලබා දීමේදී තමන්ද එම

වගකීමට බැඳෙන බැවින් අනුමැතිය ලබා දිය නොහැකි බවත්, ඒ අනුව එතුමා ඉහත යෝජනාවට විරුද්ධ වන බවත් පවසන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමාද එම යෝජනාවට විරුද්ධ වන බව පැවසීය. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා අදහස් දක්වමින් කර්මාන්ත කාරක සභාවේ සභාපති ලෙස මුදල් කාරක සභාවෙන් මුදල් වෙන් වන ප්‍රමාණයන් පිළිබඳව තමන් දැනුවත් නොමැති බව ප්‍රකාශ කලේය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්හෙට්ටිආරච්චි මැතිතුමා නැවතත් අදහස් දක්වමින් පැවසුයේ ඉදිරිපත් කර ඇති දෛනික වැටුප් වාර්තාව අනුව ආර්.කේ.ඩී නිලන්ති යනුවෙන් Field worker කෙනෙකු ලෙස දක්වා ඇති නමුත් Field worker කෙනෙක් ලෙස ස්ත්‍රියක් වැඩ කරනවා දැක නැති බවත්, කම්කරුවන්ගේ ගැටළුවක් පවතින බවත්, කර්මාන්ත හා නඩත්තු යෝජනාවක් සිදුකළ යුත්තේ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව බවත්, නමුත් මෙහි සිදුවන්නේ කාර්යය සිදුකර පසුව අනුමත කර ගැනීම බවත්, මුදල් සම්බන්ධ විනිවිදභාවය යන්න උපරිමයෙන් තිබිය යුතු බවත්, මේවා අනුමත කිරීමෙන් පසු වගකීමට බැඳෙන්නේ සභාව බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ කර්මාන්ත සිදුකිරීමේදී ඇස්තමේන්තු ලබාදෙන ලෙස පුන පුනා ප්‍රකාශකළද මේ වන තෙක් එම ඇස්තමේන්තු සභාවට ඉදිරිපත් කර නොමැති බවයි.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සඳහන් කලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් නම් සිදුකරනු ලබන කර්මාන්ත සඳහා ගල්,වැලි ආදිය සඳහා යන වියදම ආදී ලෙස සටහන් කරගෙන ඒ අනුව ද්‍රව්‍ය වලට ගෙවීම් කරන බවත්, මෙහි සිදුවන්නේ කුමක්ද යන්නවත් පැහැදිලි නොවන බවයි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමේදී ගල්,වැලි,තාර ආදී ද්‍රව්‍ය සභාවෙන් ලබාදෙනු ලබන බවත්, ඍජු ශ්‍රමය සඳහා දෛනික වැටුප් මත සේවකයන් මිලදී ගන්නා බැවින් ඇස්තමේන්තු අවශ්‍ය බවත්, මුදල් පිළිබඳ විනිවිදභාවය සඳහා එය අත්‍යවශ්‍ය බවත්ය. මෙහිදී ගරු සභාපතිතුමා නඩත්තු හා කර්මාන්ත කටයුතු වලට අදාළ ඇස්තමේන්තු සභාවට ඉදිරිපත් කරන ලෙස කාර්මික නිලධාරී මහතා වෙත උපදෙස් ලබා දෙන ලදී

මෙහිදී ඉහත ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූ පරිදි ඉදිරිපත් කර ඇති දෛනික වැටුප් වාර්තාව අනුව ආර්.කේ.ඩී නිලන්ති යනුවෙන් සඳහන් වන Field worker පිළිබඳ විස්තර ලබා දෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසීය.

අනතුරුව වැටුප් ලේඛනය පිළිබඳ තොරතුරු සාකච්ඡා කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී. අදාළ සාකච්ඡාවෙන් පසු ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් කරන ලදී.

ගරු සභාපතිතුමා මෙහිදී න්‍යාය පත්‍රයේ සැප්තැම්බර් මස ලෙස වැරදීමෙන් මුද්‍රණය වුවද එය ඔක්තෝම්බර් මස ලෙස නිවරදි විය යුතු බවත්, නමුත් වටිනාකම නිවරදි බවත් සඳහන් කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා ඉහත වැටුප් ගෙවීමේ යෝජනාවට විරුද්ධ වන බවත්, ගරු නාගරික මන්ත්‍රීනි පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය එතුමියද ඉහත යෝජනාවට විරුද්ධ වන බවත්, මේ වෙනුවෙන් බෙදීමක් යෝජනා කරන බවත් පැවසීය.අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමා පැවසුයේ යෝජනාව පිළිබඳ විරුද්ධත්වය දැක්වීම් සටහන් කිරීම ප්‍රමාණවත් බවයි.ඒ අනුව ඉහත 2025 ඔක්තොම්බර් මස දෛනික වැටුප් රු.1,629,774.98 ක් ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීමේ යෝජනාවට විරුද්ධ වන බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා, එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රීනි පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා,ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය යන ගරු සභිකවරුන් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ අනෙකුත් ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා මෙම ගෙවීම වෙනුවෙන් එකඟවන බැවින් ඉහත අනුමැතිය ලබා දිය යුතු බවයි.

**ඒ අනුව ඉහත යෝජනාව සභා සම්මත විය.**

**07:01:20** කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍රය අක්‍රිය වී ඇති බැවින් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් එහි නියෝජිත ආයතනය වන Gestetner OF CEYLON PLC ආයතනයෙන් රු.114,412.88 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති බැවින් එම අළුත්වැඩියාව සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ මෙම යන්ත්‍රය නිතර අළුත්වැඩියා කරන බැවින් මෙතරම් මුදලක් ගෙවා අළුත්වැඩියා කිරීමට වඩා නව යන්ත්‍රයක් මිලදී ගැනීම සුදුසු බවයි.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා නව ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදි ගැනීමට යෝජනා කරන ලදුව ගරු නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

මෙහිදී වැට් බදු සම්බන්ධව පැහැදිලි කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදුව අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

පසුව සභාවේ යෝජනා වූ පරිදි නව නව ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදි ගැනීමට ගරු සභාපතිතුමා යෝජනා කළ අතර එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ඒ අනුව ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:21** 2025 නොවැම්බර් මස ඉන්ධන බිල්පත් පියවීම වෙනුවෙන් BKJ Petroleum වෙත රු.955,027.44 ක් ගෙවීම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින්, රු.955,027.44 ක බිල්පතක් ගෙවීම් කිරීමට ඉදිරිපත් කර තිබුනද 2025 නොවැම්බර් ඉන්ධන වාර්තාව ලෙස ඉදිරිපත් කළ වාර්තාවේ සඳහන් වන වටිනාකම් අනුව රු.875,557.95 ක් බවත්, ඒ අනුව වෙනසක් පවතින බවත්, තණකොළ කපන මැෂින් එකට ලීටර් 35ක් ඉන්ධන ලබා ගෙන ඇති බවත්, ආපදා තත්වය හේතුවෙන් දෙසැම්බර් මසදී නම් ඉන්ධන වියදම වැඩි වුවද නොවැම්බර් මස එසේ වීමට හේතුවක් නොවන බවත්, අඛණ්ඩව ඉන්ධන බිල වැඩිවීමක් සිදුවී ඇති බවත්, නමුත් වාහන ප්‍රමාණය වැඩි වීමක් සිදු නොවී ඉන්ධන බිල්පත වැඩිවී ඇති බවත්, මූල්‍ය සම්බන්ධ ගැටළුවක් බැවින් දැඩි අවධානය යොමුකළ යුතු බවත් පවසන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පැවසූයේ ත්‍රීරෝද රථයේ ලීටරයකට කිලෝමීටර් 20ක් ධාවනය කළ හැකි බවත්, වෑන් එක සහ fotonරථයේ ලීටරයකට කිලෝමීටර් 06 ක් පමණ ධාවනය කළ හැකි බවත්, එයද කළමණාකරණය කර ගත යුතු බවත්, කලින් සිටි ලේකම්තුමා සිටියදී ත්‍රීරෝද රථයේ ගමන් කළ හැකි ගමන් සඳහා මෝටර් බයිසිකලය යොදා ගත් අවස්ථා දැක ඇති බවත්,දැන් එම තත්වය නැති වී ඇති බවත්, එබැවින් එය වාහන භාවිතයේදී කළමණාකරණය කර ගත යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බණ්ඩාර මැතිතුමා, ඉදිරිපත් කර ඇති ඉන්ධන බිල්පත සහ ලබා දී ඇති ඉන්ධන වාර්තාව අතර ඇත්තටම වෙනසක් පවතින බවත්, මෙසේ වෙනස් වන්නේ ඇයිද යන්නත්, එබැවින් සම්මත කර ගන්නා කාරණා පිළිබඳ විස්තර එකින් එක බැලීමට සිදුවන බවත්, මෙය ගැටළුවක් බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පැවසූයේ එවන වාර්තා වල බොහෝ විට අකුරු වැරදි, පිටු වැරදි ආදිය ඇති බවත්, තමන්ගේ පළමු සභාවාරය මෙය බැවින් මීට පෙර එසේ සිදුවනවාද යන්න නොදන්නා බවත්, වාර්තා පිළියෙල කරනු ලබන නිලධාරින් ඒ පිළිබඳ සැලකිලිමත් වන ලෙස ඉල්ලා සිටින බවත්ය.

පසුගිය වාරයක සභාවේ ගැටුමකට හේතු වූයේද මෙවන් කාරණාවක් බවත්, ඒ හේතුවෙන් එහිදී මන්ත්‍රීවරුන් අතරේ ගැටළුවකට හේතු වූ බවත්, නමුත් මන්ත්‍රීවරුන් අතරේ පෞද්ගලිකව එලෙස කිසිම ගැටළුවක් නොවන බවත්, කලින් සභා වාර නියෝජනය කළද මෙලෙස සිදු වී නොමැති බවත් ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසූයේ මන්ත්‍රීවරුන් සභාවට පැමිණෙන්නේ මසකට වරක් බවත්, නිකන් ලබා දෙන කොළයේ මෙතරම් අඩුපාඩු පවතීනම්, අංශ ප්‍රධානියෙක් යටතේ කී දෙනෙකු සිටියත් වැඩක් නැති බවත්, නදීක මන්ත්‍රීතුමා පැවසූ පරිදි ඉස්සර එහෙම වෙන්නේ නෑ දැන් වෙනවා නොව ඉස්සරත් එහෙම වුනා දැනුත් වෙනවා යන්නත්, කොතරම් පැවසුවද වැඩක් නැති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ තණකොළ කපන යන්ත්‍රය සඳහා ඉන්ධන ලීටර් 35ක ප්‍රමාණයක් ලබාගත්තද ක්‍රීඩා පිටියේ තණකොළ මේ වන විට වැවී ඇති බවයි.

මෙහිදී දිගින් දිගටම මෙවැනි අඩුපාඩු සිදුවීමට ඉඩදිය නොහැකි බවත්, අදාළ අංශ ප්‍රධානීන් නිලධාරින්ගෙන් විමසිය යුතු ගැටළු ඉදිරිපත් කර පිළිතුරු ලබා ගැනීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් කරන ලදී.

**ඒ අනුව ඉහත යෝජනාව සංශෝධනය කර ඉදිරි සභාවක් වෙත ඉදිරිපත් කිරීමට ගරු සභාවේ තීරණය විය.**

**ප.ව.1.02ට පමණ ගරු සභාපතිතුමා මූලාසනය ගරු උප සභාපතිතුමාට භාර දී අසනීප තත්වයක් හේතුවෙන් සභාවෙන් පිටවන ලදී.**

**07:01:22** පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ ඉටු කිරීමට නියමිත බැංකියවත්ත කසල කලමනාකරණ මධ්‍යස්ථානය සඳහා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම(රු.2,915,000.00)

බළන්ගොඩ නගර සභාවට අයත් බැකියවත්ත කසල කලමනාකරණ මධ්‍යස්ථානයේ ඇති යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාව සඳහා පිරිවිතර ලබා ගෙන ඇති අතර, එම කටයුතු ඩෙක්මා ආයතනය මගින් ඉටු කරවා ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී යන්ත්‍රෝපකරණ කුමක්ද යන්න විමසන ලදුව ගරු උප සභාපතිතුමන්ගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

කාර්මික නිලධාරී මහතාගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමන්ගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:23** බලංගොඩ නගර සභාව සඳහා හලර් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මගීන් රු.4,000,000.00 ක ප්‍රතිපාදන වෙන් වී ඇති බැවින් හා ඒ සඳහා පිරිවිතරද ලබා ගෙන ඇති බැවින් එකී මිලදි ගැනීම ඩෙක්මා ආයතනය මඟින් ඉටුකරවා ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02** **ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා**

**07:02:01** තුඹගොඩ සාංඝිකාරාමයේ මිහිඳු පෙරහැර කටයුතු සඳහා 2026 අයවැය මඟින් මුදල් වෙන්කර නොමැති බැවින් 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ලබාදෙන රු.75,000 මුදල ඒ වෙනුවෙන් ලබා දීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03** **ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා**

**07:03:01** 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ලබාදෙන රු.75,000 මුදල හැපි කිඩ්ස් පෙර පාසල හා දාරුල් හික්මා පෙර පාසලේ පාසල් උපකරණ (ඩෙස්/පුටු) ලබා දීම වෙනුවෙන් යෙදවීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04** **ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා**

**07:04:01** 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ලබාදෙන රු.75,000 මුදල ඇල්ලෙඅරාව එක්සත් මාවත නළ ළිඳ සාදා නිම කිරීම සහ බට සහ ටැංකිය ලබා ගැනීම වෙනුවෙන් යෙදවීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05** **ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය**

**07:05:01** 2025 වර්ෂයේ සභිකයෙකු වෙත ලබාදෙන රු.75,000 ප්‍රතිපාදන යටතේ වොට් 170 සෝලා වීථි ලාම්පු සහ ගේජ් 1.6 ආධාරක බට ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05:02** අනදමෙත්ගම තැපැල්පෙට්ටිය අසළ මාර්ගය නඩත්තු කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05:03** කිරිදිගල බැංකුවේ ගෙදර පුන්‍යදාස මහතාගේ නිවෙස් වලට යන මාර්ගය නඩත්තු කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06** **ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා**

**07:06:01** 2025 වර්ෂයේ සභිකයෙකු වෙත ලබාදෙන රු.75,000 ප්‍රතිපාදන යටතේ වොට් 170 සෝලා වීථි ලාම්පු සහ ගේජ් 1.6 ආධාරක බට ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06:02** කිරිදිගල ජල සම්පාදන මණ්ඩල මාර්ගය නඩත්තු කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06:03** වැලිහරනාව ඇල්ලෙවත්ත ගමට ප්‍රවිශ්ට වන මාර්ගයේ ආරම්භක ස්ථානය ඉතා අවධානම් මට්ටමක පවතී.එය කඩිනමින් නඩත්තු කර දෙන ලෙස යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06:04** චේන්සෝ යන්ත්‍ර පිළිබඳව සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා ඉහත යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් පසුගිය දිනවල ඇතිවූ ආපදා තත්වය සමඟ චේන්සෝ යන්ත්‍රය අත්‍යවශ්‍ය වූ බවත්, අවදානම් ගස් ඉවත් කිරීමට චේන්සෝ යන්ත්‍ර අවශ්‍ය වූ බවත්,නමුත් සභාව සතු එක් චේන්සෝ යන්ත්‍රයක් අළුත්වැඩියාවට යොමුකර ඇති බවත්,මාස 05ක් තිස්සේ එම අළුත්වැඩියාව සිදු කරන බවත්, එම යන්ත්‍රයද කඩිනමින් අළුත්වැඩියා කරන්නේ නම් එයින්ද වැඩ කටයුතු සිදුකරගත හැකි බවත්, ඒ පිළිබඳව අවධානය යොමුකරන ලෙසත් පවසන ලදී.

මෙහිදී අදාළ කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.කාර්මික නිලධාරී මහතාගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**07:06:05** පසුගිය කාල සීමාව තුළ සිදුකරන ලද නඩත්තු ව්‍යාපෘතිවලට වියදම් වූ මුදල් ප්‍රමාණයන් පිළිබඳ ඇස්තමේන්තු සභාවට ඉදිරිපත් කරන ලෙස යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ න්‍යාය පත්‍රය සමඟ මෙම තොරතුරු ඉදිරිපත් කරන ලෙස දැන්වූවද එය සිදු කර නොමැති බවත්, එසේ එවා තිබුනේනම් අධ්‍යයනයක් කර පැමිණිය හැකි බවත්, බුද්ධජයන්ති මාර්ගයේ නඩත්තු කාර්යයක් කිසිම ඇස්තමේන්තුවක් නොමැතිව කරගෙන යන බවත්, කාර්යය සිදුකළ යුතු වුවද ඇස්තමේන්තුවක් සහිතව කිරීම සුදුසු බවත්ය.

ගරු උප සභාපතිතුමා පැවසුයේ ඉදිරි සභාවන් වෙත එම තොරතුරු ඉදිරිපත් කරන බවයි.අදාළ ඇස්තමේන්තු පිළිබඳව කාර්මික නිලධාරී මහතාගෙන් කරුණු විමසීම් කිරීම වෙනුවෙන් ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත්වූ අතර අදාළ කරුණු විමසීම් කිරීමෙන් පසු ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්විය.

**07:07** **ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

**07:07:01** බළන්ගොඩ කොට්ඨාශයේ උඩකන්ද පාර, ගල්වල පාර, වතුකාරගොඩ පාර, පරගහකුඹුර පාර, වැලිගල මාවත, පන්සලවත්ත පාර, මිරිස්කොටුව පාර, ගහ පාර, ආචාරිමලේ පාර ඇතුළු සියළු මාර්ග කාණු පද්ධතිය සුද්ද කිරීම හා එළි පෙහෙළි කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:07:02** වතුකාරගොඩ කුලතුංග මහතාගේ කඩය අසළ පාලම අසළ ඇළට කැඩී ගොස් ඇති කොටසට පැති බැම්මක් ඉදි කරදීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා පැවසුයේ ඉහත යෝජනාව ආපදා ප්‍රතිසංස්කරණ යෝජනාවක් ලෙස ඉදිරිපත් කළ හැකි බවයි.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ ආපදා ලෙස ඉදිරිපත් කිරීමට යෝජනා

ඉදිරිපත් කරන ලෙස සභාවේ සමූහයක් වෙත ලේකම්තුමිය දැන්වූ බවත්, ඒ අනුව යෝජනා ඉදිරිපත් කළ බවත්, නමුත් ඒවා සලකා බැලීමක් සිදු නොවූ බැවින් එම යෝජනා ඉවත් කරගත් බවත්, සිසිල මන්ත්‍රීතුමා කිරිදිගලටද වැඩිම ආපදා සිදුවූයේ යැයි විමසූ බවත්, ඇත්තටම බළන්ගොඩ ප්‍රදේශයේ උස් භූමියක් තිබෙන්නේ කිරිදිගල සහ බෝම්බුව ප්‍රදේශවල බවත්, එබැවින් එම ප්‍රදේශවලට විවිධ ආපදා සිදුවූ බවත්ය.

මෙහිදී ගරු උප සභාපතිතුමා පැවසුයේ පුනරාවර්ථන වියදම් මිලියනයක සීමාවකට යටතේ ආපදා නඩත්තු වෙනුවෙන් ප්‍රතිපාදන ලැබෙන බැවින් ඊට අදාළව සිදුකළ හැකි නඩත්තු යෝජනා ලබා දෙන ලෙසත් එම නඩත්තු සිදුකර බිල්පත් ඉදිරිපත් කිරීමේ හැකියාව පවතින බවත්ය..

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:07:03** 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබාදෙන රු.75,000 මුදලින් බළන්ගොඩ සිට බෝම්බුව දක්වා මාර්ගයේ බෝම්බුව බෝධිමණ්ඩලාරාමය ඉදිරිපිට කැඩී ගොස් ඇති පැති බැම්ම සැකසීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් තමාගේ බළන්ගොඩ කොට්ඨාශයේ පාරවල් ගොඩක් අබලන් වී ඇති බවත්, මෙම මාස හයටම කිහිප වතාවක් මෙම කාණු සුද්දකර දෙන ලෙස ඉල්ලීම් කළ බවත්,කර්මාන්ත කාරක සභාවේ සභාපතිතුමාද ඒ බව දන්නා බවත්, ඇත්තටම හරිම කණගාටු බවත්, දිනකදී සේවකයන් දෙදෙනෙකු ගොස් ජේ.සී.බී යන්ත්‍රයෙන් එම කාර්යය කළ යුතු බව පවසා ආපසු පැමිණ ඇති බවත්,එම මාර්ගවල ජේ.සී.බී යන්ත්‍රය ගියහොත් තිබෙන පාරද අබලන් වන බවද,උඩකන්ද සිට බෝම්බුව දක්වා මාර්ග එකක්වත් සුද්ද කර නොමැති බවත්, සමහර තැන්වලින් වාහන ගස්වලින් වැහිලා යන බවත්,ඒ තරම් කැළෑව බවත්, දිස්ත්‍රික් මන්ත්‍රීතුමා සමඟ ගොස් මුල්ගලක් තැබූ මාර්ගයේ විවෘත කිරීමේ පොල් අත්තද වේයෝ කා ඇති බවත්, තමන්ගේ කොට්ඨාශයේ කිසිඳු වැඩක් සිදු වී නොමැති බවත්, මෙතනට ඇවිත් මුදලක් අරගෙන යාම නොව ජනතාවට සේවයක් විය යුතු බවත්, සභාව මීට වඩා මේ ගැන උනන්දු විය යුතු බවත්ය.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසූයේ පසුගිය දිනවල ඇති වූ විශාල වර්ෂාපතනයත් සමඟ වතුකාරගොඩ කුලතුංග මහතාගේ කඩය අසළ මාර්ගයේ විශාල ජල පාරක් එන

බවත්,මීට කලිනුත් එම මාර්ගයට කාණු පද්ධතියක් ඉල්ලුම් කළ බවත්, කඩාගෙන ගොස් ඇත්තේ විශාල ජල පහරක් පැමිණීම හා බෝක්කු නොමැති වීම හේතුවෙන් බවත්, එබැවින් එය ආපදා ප්‍රතිසංස්කරණ යෝජනාවක් ලෙස එය ඉදිරිපත් කළ බවත්, කර්මාන්ත කමිටුවේ සභාපතිතුමාට නැවත වතාවක් මෙම සභාවේ මෙය කතා කිරීමට ඉඩ නොදී එම නඩත්තු සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා පැවසුයේ විමලසිරි මන්ත්‍රීතුමා සඳහන් කළ මාර්ගයේ වැඩකටයුතු ආරම්භ කළ බවත්, නමුත් පසුගිය දිනවල පැවති වැසි සහිත කාලගුණය හේතුවෙන් එම මාර්ගයේ වැඩ කටයුතු නතර කළ බවත්, කාලගුණ තත්වය හේතුවෙන් තාර දැමීම සිදුකිරීම නොකළ යුතු බව එතුමාම පවසා තිබූ බවත්ය.

කර්මාන්ත කාරක සභාවේ සභාපති ලෙස තමාට වැඩ කරන්න හැකියාව පවත්නා බවත්, නමුත් වැඩ කිරීමට තිබෙන්නේ අවම දේපල හා අවම වත්කම් ප්‍රමාණයක් බවත්, සේවකයන් 07දෙනෙකු ලෙස දක්වා ඇති නමුත්, සමහර දිනවල 03 දෙනෙකුවත් නොමැති බවත්, මන්ත්‍රීවරුන් ලෙස පෞද්ගලිකව නොසලකා සියළුම දෙනාගේ ඉල්ලීම් මත වැඩ සිදුකරන බවත්, මෙහි පවතින්නේ කැඩුණු ජේ.සී.බී යන්ත්‍ර දෙකක් සහ මිනිසුන් 04,05 දෙනෙකු පමණක් බවත්, මෙවැනි සීමිත සම්පත් ප්‍රමාණයක් පවතින තත්වයක් තුළ කර්මාන්ත කමිටුවේ සභාපති වීම පිළිබඳ දුක් වන බවත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පවසන ලදී.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසූයේ කර්මාන්ත කාරක සභාව ලෙස රැස්වී වැඩ සැලසුම් කළද මෙම වර්ෂයේදී වියදම් කිරීමට ඇති මුදල් ප්‍රමාණය වත් තමන් නොදන්නා බවත්, තමන් මුදල් කමිටුවේ සාමාජිකයෙකු නොවන බවත්, කිසිම අවස්ථාවක ඒ පිළිබඳ දැනුවත් කිරීමක් නොකරන බවත්, ඊළඟ වර්ෂයේදී කර්මාන්ත කාරක සභාවේ සභාපති වීමට කිසිම අදහසක් නැති බවත්,මෙලෙස පවත්නා අවම සම්පත් ප්‍රමාණයකින් වැඩ කිරීමේ හැකියාවක් නොමැති බවත්, සියළු දෙනා එකතු වී මෙම ක්‍රමවේදය විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට තමන් යෝජනා කරන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසුයේ කර්මාන්ත කමිටු සභාපතිතුමා අපහසුතාවයට පත් කිරීමට තමන් අදහස් නොකළ බවත්, වැඩ කිරීමේදී ජනතාවට බොරු කීමට නොහැකි බවත්ය.

කර්මාන්ත කාරක සභාවේ සභාපතිතුමාගේ ප්‍රකාශය පිළිබඳ දුක හිතෙන බවත්, මාසයේ දවස් 30න් 20ක් පමණ කර්මාන්ත අංශය හැමදාම වැඩ කරන බවත්, වාහන මිනිසුන් නිලධාරීන් සියළුම දෙනා වැඩ වුවත් සිදුව ඇත්තේ වැඩපිළිවෙළක් නොමැතිකම බවත්,

කර්මාන්ත කමිටුවේ සභාපති ලෙස එතුමා එහි සිදුවන වැඩ දන්නේත් නැති බවත්,එය නිවරදි කරගන්නා ලෙසත් ගරු නාගරික මන්ත්‍රී නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් පැවසූයේ කාණුවක් ගොඩ දැම්මොත් පස් ටික උඩ දමා එන බවත්, ආපසු වර්ෂාව ඇතිවූ විට එම පස් ටික කාණුවට යන බවත්, එවැනි දේ සිදුවන්නේ විධිමත් සම්බන්ධීකරණයක් නොමැතිකම හේතුවෙන් බවත්, එය නිවරදි කරගැනීම කළ යුතු බවත් පවසන ලදී.

මුදල් කාරක සභාවේ තීරණ පිළිබඳව කර්මාන්ත කාරක සභාවේ සභාපතිතුමා නොදන්නේ නම් ඉදිරියට එතුමාද මුදල් කාරක සභාවට සහභාගී විය යුතු බව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පැවසීය.

මෙහිදී ගරු උප සභාපතිතුමා පැවසූයේ මෙම කාරක සභා පිහිටුවීම ජනවාරි මසදී අලුත්කරන බැවින් එහිදී අවශ්‍ය ගැලපීම් සිදුකරගත හැකි බවයි.

**07:08** **ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා**

**07:08:01** පෙර ලබාදුන් යෝජනාවල මෙතෙක් ප්‍රගතිය ඉදිරිපත් කරන ලෙස යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු උපසභාපතිතුමා පැවසූයේ අදාළ තොරතුරු මන්ත්‍රීතුමාට ලබාගත හැකි බවයි.

**07:08:02** 2025 වර්ෂයේ සභිකයෙකු වෙත ලබාදෙන රු.75,000 ප්‍රතිපාදන යටතේ සෝලා පැනල් 03ක් ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:09** **ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

**07:09:01** බළන්ගොඩ නගරයේ වාහන නවතා තැබීමේදී රිසිට්පත් කැඩීම සම්බන්ධයෙන් නොයෙකුත් ගැටළු මතු වී ඇත.මේ සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සකස් කරන්න.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සුනේත්‍රා.ඩී.වීරසිංහ මැතිතුමිය ඉහත සඳහන් යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් පැවසුයේ මෙම ගැටළුව බළන්ගොඩ නගරයේ ඉතා විශාල ලෙස බලපා ඇති බවත්,වාහනයක් නතර කිරීමේදී නතර කරන සැණින් ගොස් ටිකට් කඩන බවත්, සභාවට පැමිණි පළමු මාසේම මේ පිළිබඳ දැනුවත් කර ටෙන්ඩර්කරු ගෙන්වා දැනුම්දෙන ලෙස පැවසුවද තවමත් එම කාර්යය සිදුවී නොමැති බවත්, එම ටිකට්පත් නිකුත් කරන සේවකයන් හට නිසි ඇඳුමක් නැති බවත්, පොත්වල සීල් නැති බවත්, නිසි ක්‍රමවේදයකින් මෙය සිදුවිය යුතු බවත්, වාහනයක් නතර කර ටිකට්පතක් නිකුත් කිරීමට අදාළ වෙලාවක් මෙන්ම ඔවුන්ට ඇඳුමක් සභාවෙන් ලබා දී ඇති බැවින් ඒ සම්බන්ධව ටෙන්ඩර්කරු දැනුවත් කරන ලෙසත්, පළමු සභා වාරයේ සිටම ඉදිරිපත් කළ සුසානභූමියේ පවතින ගැටළු පිළිබඳ කතා කළ බවත්, අදදිනත් ඒ පිළිබඳව දන්වා නදීශාන් මන්ත්‍රීතුමා ලිපියක් ඉදිරිපත් කළ බවත්, කාන්තා මන්ත්‍රීනීයන් සිටින්නේ දෙදෙනෙකු පමණක් බවත්, කුඩම්මාගේ සැලකිලි නොකරන ලෙසත්,ඉදිරිපත් කරන යෝජනා කිසිවක් ඉටු නොවීම පිළිබඳව කණගාටු වන බවත්, හැකි ඉක්මනින් මෙම කරුණු පිළිබඳව සලකා බලා කඩිනමින් වැඩ කටයුතු සිදුකිරීමට අදාළ නිලධාරින් දැනුවත් කිරීම සිදුකරන ලෙසත් දන්වන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සඳහන් කලේ රථවාහන නැවැත්වීම් ගාස්තු අයකිරීමට නියමිත වෙලාවක් පවතින බවත්, නමුත් වාහනයක් නවත්වා විනාඩියක්වත් ගතවීමට ප්‍රථම ටිකට් කඩන පුද්ගලයන් පැමිණ ටිකට්පත් කඩනු ලබන බවත් ටෙන්ඩර්කරුවන් දැනුවත් කළ යුතු බවත්ය.

ගරු උප සභාපතිතුමා පැවසුයේ ටෙන්ඩර්කරුවන් ගෙන්වා මෙම කරුණු පිළිබඳ දැනුවත් කිරීම සුදුසු බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:09:02** 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබාදෙන රු.75,000 මුදල මරණාධාර හා අනෙකුත් සමිති සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමට යෙදවීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:10** **ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා**

**07:10:01** පසුගිය ආපදා තත්වයන්ගෙන් හානි වූ බදුල්ල ප්‍රදේශයේ ශ්‍රම මෙහෙයුමක් සඳහා බළන්ගොඩ නගර සභාවේ සියලුම මහත්ම මහත්මීන් එක දිනක ශ්‍රම දායකත්වය සඳහා සහභාගී වීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:10:02** බුලත්ගම පාසලට ගමන් කරන මාර්ගයේ බස් හෝල්ට් එක ඉදිකිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:10:03** 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබාදෙන රු.75,000 මුදල, පසුගිය ආපදා තත්වයන් නිසා මුළුමනින්ම නිවාසය විනාශ වූ තුඹගොඩ කිච්ලෙවෙල නිවස ඉදිකිරීම සඳහා යෙදවීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:11** **ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා**

**07:11:01** 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබාදෙන රු.75,000 මුදල, පසුගිය ආපදා තත්වයන් නිසා මුළුමනින්ම නිවාසය විනාශ වූ තුඹගොඩ කිච්ලෙවෙල නිවස ඉදිකිරීම සඳහා යෙදවීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:11:02** පරිගණක නොමැති නිසා අක්‍රමවත් වී ඇති විද්‍යුත් පුස්තකාලය මහජන පුස්තකාලයේ ශාඛාවක් බවට පත් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පැවසුයේ 2022 වර්ෂයෙන් පසු විද්‍යුත් පුස්තකාලය ක්‍රියාකාරී වී නොමැති බවත්, එබැවින් පුස්තකාලයේ ශාඛාවක් බවට පත්කර එහි සිටින කාර්යමණ්ඩලය සහා කාර්යාලයේ කටයුතු සඳහා යොදා ගන්නා ලෙසයි.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ එතුමා ඉදිරිපත් කළ යෝජනාවේ අඩුපාඩුවක් පවසනවා නොව, නමුත් විද්‍යුත් පුස්තකාලය යනු ලංකාවේ පළාත් පාලන ආයතනවලින් බිහිවූ පළමු විද්‍යුත් පුස්තකාලය බවත්, එයට සම්මාන පවා ලබාගත් බවත්, 2023 වර්ෂය දක්වාම එහි වැඩසටහන් පැවති බවත්, දැනට එහි පරිගණක නොමැතිවීම හේතුවෙන් අක්‍රිය තත්වයේ තිබේනම් එලෙස සිදුවී ඇති බවත්, සිදුවිය යුත්තේ එයට අවශ්‍ය පරිගණක ආදි පහසුකම් ලබා දී යාවත්කාලීන කිරීම බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුයේ කල් දී ප්‍රශ්නවලදී සංකල්ප මහතාගේ රාජකාරී ලයිස්තුව ඉල්ලූ බවත්, එම අවස්ථාවේදී තමන් කතා කිරීමට සිටි නමුත් සභාපතිතුමා එම ප්‍රශ්නයට අදාළ පිළිතුර ලබා දුන් බවත්, සංකල්ප මහතා අනු ගණන්වල සිට සිටින නිලධාරීතුමෙකු බවත්, එතුමා මෙම සභාවට විශාල මෙහෙයක් සිදුකළ බවත්, එය මේ අවස්ථාවේදී පැවසිය නොහැකි පත්තරයක් වැනි දෙයක් බවත්, එම විද්‍යුත් පුස්තකාලය නැතිකරලා මෙතන යට වෙනත් ව්‍යාපාරයක් තියාගෙන කතාකරන බවත්, සභාවේ බහුතරය අනුව එම ස්ථානය කඩලා හරි වෙනත් ස්ථානයකට රැගෙන ගොස් හෝ එය කරනු ඇති බවත්,නමුත් ඒ වෙනුවෙන් ප්‍රකාශකළ යුතු දේ පැවසිය යුතු බවත්, එතුමා තොරතුරු තාක්ෂණය සම්බන්ධව ඉතා දක්ෂ නිලධාරීයෙකු බවත්,පළාත් පාලනය සම්බන්ධව මෙන්ම රාජ්‍ය නිලධාරින් තොරතුරු තාක්ෂණය සම්බන්ධව පුහුණුකිරීම ආදියද එතුමාගෙන් සිදුවන බවත්,Gov pay ආදී සංකල්ප පවා සභාවට රැගෙනඒමට එතුමා දායකවූ බවත්, පිටින් මුදල් ගෙවා සිදුකරන කාර්යයන් රැසක් එතුමාගෙන් මෙම ආයතනයට ලැබෙන බවත්, අතිකාලවත් ලබාගන්නේ නැතිව එතුමා වැඩ කරන කෙනෙකු බවත්,සිදුකළ යුත්තේ එම ස්ථානයේ තිබෙන දේවල් මෙතනට ගෙන ඒම නොව අවශ්‍ය

පහසුකම් ලබාදී විද්‍යුත් පුස්තකාලය දියුණුකිරීම බවත්, යෝජනාවට පක්ෂ වන්නේ එම ස්ථානය දියුණුකිරීමට පමණක් බවත්, පරිගණක යනු මොනවාද යන්නවත් නොදන්නා කාලයේ එතුමා මෙම සභාවට පැමිණ සෑම දෙයක්ම පද්ධති බවට පත්කරලා මේ තත්වයට දියුණු කර ඇති බවත්, සංකල්ප මහතාගේ දුර්වලකමක් නොව දැන් සිදුවී ඇත්තේ එතුමාගේ දැනුමෙන් සභාව ප්‍රයෝජනයක් නොගැනීම බවත් සඳහන් කරමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

මෙහිදී  ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පැවසුයේ සංකල්ප මහතා අවතක්සේරු කිරීමක් නොකළ බවත්, එතුමාගෙන් වැඩ ටික ලබා නොගන්නා බව පැවසූ බවත්, එතුමාගේ දක්ෂතාවයන් යොදාගෙන කාර්යක්ෂමව සභාවේ කාර්යයන් සිදුකරගැනීමට යෝජනාව ඉදිරිපත් කළ බවත්,එතුමාගේ රාජකාරී ලයිස්තුවේ සැලකිය යුතු තරම් කුසලතා ප්‍රමාණයක් පවතින බවත්, ඒ අනුව ඒවා යොදාගෙන මෘදුකාංග සැකසීම වැනි දේ සඳහා යොදා ගත්තානම් තොග පාලනය ආදී කාර්යයන් ඉතාම පහසුවන බවත්, නොමිලේ ලබාගතහැකි මෘදුකාංග ලබා ගෙන කාර්යයන් පහසු කරගත හැකි බවත්, එවැනි දේවල් එතුමාගේ දක්ෂතා වලින් කරගත හැකි බවත්ය.

**07:12** **ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා**

**07:12:01** 2026 වර්ෂය සඳහා තානායමේ බාර් බලපත්‍රයද යාවත්කාලීන කරමින් තානායම වසා තැබීම නිෂ්ඵල ක්‍රියාවකි. තවද තානායම පවරා ගන්නා දිනයක් මෙතෙක් ලබා දී නොමැත.එමෙන්ම ලංකාවේ අනෙකුත් පළාත් පාලන ආයතන සතු තානායම් වසා නොමැත.එම නිසා බළන්ගොඩ නගර සභාවේ තානායම මේ පවත්නා තත්වය යටතේ ආරම්භ කර සභාවට ආදායම් ලබා ගත යුතුයි කියා යෝජනා කරමි.මේ සඳහා ටෙන්ඩර් කිරීම හෝ සභාව විසින් සිදු කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා, මේ වන විට නව වර්ෂයට තානායම් බලපත්‍රයද ලබා ගැනීමට අවශ්‍ය කටයුතුද සිදුකරමින් පවතින බැවින්,තානායම වසා තැබීම නිෂ්ඵල බවත්,පවරාගැනීම පිළිබඳව නිශ්චිතව දන්වා නැති බවත්, මෙය සභාවෙන් පවත්වාගෙන යාමට යෝජනා කරන බවත්ය.

මින් පෙරද සභාවේ මෙම යෝජනාව ස්ථිර වූ බවත්, නාගරික සංවර්ධන අධිකාරියෙන් මේ වන විටත් පවරාගැනීම සම්බන්ධව ලිඛිතව දන්වා නොමැති බවත්, සභාවෙන් පවත්වාගෙන යාම වෙනුවෙන් යෝජනා ස්ථිර කර තිබියදීත්  තවම ටෙන්ඩර් කිරීමට

කටයුතු නොකරන්නේ ඇයිද යන්නත් ගරු නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් විමසන ලදී.ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා, සභාව නිකන් දෙනවා වගේ තානායම ලබා දීමට සූදානම් වන බවත්, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා තානායමේ බලපත්‍රය දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන බවත් පැවසූ අතර එය ලබා ගැනීමට අනුමැතිය කලින් ලබා දුන් බව සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා පිළිතුරු ලබා දුනි.

මේ අතර නව භාණ්ඩ ලබා ගැනීමකින් තොරව තානායමේ තිබෙන සම්පත් ප්‍රමාණයෙන් ප්‍රයෝජනය ගැනීමට හැකියාව ඇති බවත්, සභාවෙන් මෙය පවත්වා ගෙන යාම සිදුකරන්නේ නම් කාමර පමණක් ලබා දුන්නත් විදුලි බිල ඇතුළු බිල්පත් ගෙවා පවත්වා ගෙන යාමේ හැකියාව පවතින බවත් ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා පවසන ලදී.

ගරු උප සභාපතිතුමා පැවසූයේ මේ සම්බන්ධව අලුත්ම තත්වය පිළිබඳ තමන් දැනුවත් නොමැති බැවින් ගරු සභාපතිතුමා දැනුවත් කරන බවයි. මේ සම්බන්ධව විශේෂ සභාවක් කැඳවීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසූයේ දැනට ලැබී ඇති තොරතුරු සමඟ සාකච්ඡා කිරීමේදී, තුන්වෙනි පාර්ශවයක් සම්බන්ධ කර ගැනීමේදී තවත් ගැටළුවක් නිර්මාණය විය හැකි බවත්, මේ සම්බන්ධව කැබිනට් තීරණයක් ගෙන ඇති බැවින් මේ පිළිබඳව තීරණ ගැනීමේදී සලකා බලා තීරණ ලබා ගැනීමට සිදුවනු ඇති බවත්ය.

මේ අවස්ථාවේදී මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම පිළිබඳව බෙදීමක් යෝජනා කරන බව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසන ලද අතර මීන් පෙර මෙම යෝජනාව ඒකමතිකව සම්මත කර ඇති බව සභාවේ මතය විය.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉඩම් සම්බන්ධ මූලික අයිතිය රජයට පැවතියද අත්පත්කරගැනීම සම්බන්ධයෙන් මේ වන විට දැනුම් දී නොමැති බවයි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ තානායම සභාවෙන් ටෙන්ඩර් කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියටද ඉල්ලුම් කිරීමේ හැකියාව පවතින බවයි. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසූයේ , නමුත් 1997 දී සභාවට පැමිණ බළන්ගොඩ බස් නැවතුම්පොළ ඉදිකර නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන දීලා පසුව සභාව පැරදි 2002 වර්ෂයේදී හිටපු සභාපතිතුමා සහ තමන් විපක්ෂයේ සිටි බවත්, එවකට සිටි විමලසේන සභාපතිතුමාගේ කාලයේ තමන් සහ හිටපු සභාපතිතුමා බස් නැවතුම්පොළ බිත්ති පුපුරලා අරහෙන් බහිනවා මෙහෙන් බහිනවා ලෙස බොරු බිල්ලෙක් මවා පාමින් විවෘත නොකර සිටි බවත්, එම අවස්ථාවේ සිටි සභාව

එය පිළිගත් බවත්, තමන් ඇතුළු සභිකයන්ගේ පාලන කාලය තුළ ඉදිකළ බැවින් විවෘත කිරීමේ අවශ්‍යතාව පැවති බවත්,ඉන් පසුව 2006 ආපසු තමන් ඇතුළු කණ්ඩායම බලයට පත්වී මාස තුනක් යන විට බස් නැවතුම්පොළ විවෘත කිරීමට කටයුතු කළ බවත්, තානායමට වන්නේද මේ අකාරයටම බවත්, බොරු බිල්ලෙක් මවාගෙන සිටින බවත්, හොරකම් කරන්න මංකොල්ල කන්න, තානායම විකුණන්න යනවා නොව සභාව සතු තානායම ටෙන්ඩර් කර සභාවට ආදායමක් ලබා ගැනීමට සැරසෙන බැවින් ඒකවත් කරගන්න මෙම සභාවෙන් නොහැකිනම් එය පවත්නා සම්පූර්ණ දුර්වලකමක් බවත් එය සභාවේ බලය හිමි පක්ෂය භාර ගත යුතු බවත්ය.

ගරු උප සභාපතිතුමා පැවසුයේ ගරු සභාපතිතුමාට මේ පිළිබඳව දන්වන බවත්,කලින් සභා වාරයකදීද මෙය නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබා නොදීමට තීරණය ලබා ගත් බවත්, ඒ පිළිබඳව සභාව ඒකමතිකව සම්මත කර බවත්ය.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුයේ එම අවස්ථාවේ සභාපතිතුමාද අත ඔසවා කැමැත්ත පළ කළ නමුත් මේ වන තුරුත් ටෙන්ඩර් නොකරන්නේ ඇයිද යන්නත්, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා එදා ලබාගත් තීරණය ක්‍රියාත්මක කරානම් අද මෙලෙස ප්‍රශ්නයක් නොවන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා පැවසුයේ මේ පිළිබඳව සාකච්ඡා කිරීමට විශේෂ මහ සභාවක් ලබා ගත යුතු බවත්, නැතිනම් මෙය සභාවේ කතාකරනවා ආපසු ඉවත් කරනවා ආදිය සිදුවන බවත්ය.ගරු නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, විශේෂ මහ සභා අවශ්‍ය නැති බවත් මේ අවස්ථාවේදී ලබාගත් තීරණය ක්‍රියාත්මක කිරීමේ හැකියාව පවතින බවත්ය.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සඳහන් කලේ සභාව තීරණ ලබා ගෙන තිබියදි නැවත ලබා ගැනීමේදී සභාව හැල්ලු වන බවත්, ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමා පැවසුයේ මෙලෙස ක්‍රියා කිරීමේදී සභාව විහිලු සභාවක් වන බවත්, ලබාගන්නා තීරණ කිසිවක් ක්‍රියාත්මක නොකරන බවත්ය.ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා පැවසුයේ තමන් විශේෂ සභාවක් තැබීමට යෝජනා කලේ සභාපතිතුමා මේ පිළිබඳව දැනුවත් කරන බව ගරු උප සභාපතිතුමා පැවසූ නිසා බවයි.

මූලාසනය භාර දෙන අවස්ථාවේදී ඉදිරියට තිබෙන ප්‍රශ්න ආදියට ගරු උප සභාපතිතුමා වෙත ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දී තිබිය යුතු බව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසන ලදී.ගරු උප සභාපතිතුමා පැවසුයේ එතුමා සභාවෙන් පිටවූයේ අසනීප තත්වයක් හේතුවෙන් බවත්, ඒ අනුව එතුමා මේ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කරන බවත්ය.

මේ අවස්ථාවේදී සභාව කාරක සභාවක් බවට පත්කර මෙය ටෙන්ඩර් කිරීමේ නීතිමය රාමුව පිළිබඳව සාකච්ඡා කිරීමටත්, ඒ අනුව මින් පෙර තානායම ටෙන්ඩර් කිරීමට

තීරණයක් ලබා ගෙන තිබෙන බැවින් විශේෂ සභාවක් කැඳවීමකින් තොරව සාකච්ඡා කර ඒ අනුව ටෙන්ඩර් කිරීමේ කටයුතු කිරීමට හැකියාව පවතින බවත් ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා බළන්ගොඩ නගර සභාව සතු තානායම ඉදිරි එක් වර්ෂයකට ටෙන්ඩර් කිරීමට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:12:02** බෝම්බුව ජයන්ති ටයර් කඩය අසළ බෝක්කුව කඩිනමින් පිළිසකර කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත මාර්ගය මිරිස්කොටුව මාර්ගය ලෙස සංශෝධනය විය යුතු බව ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා පවසන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:12:03** 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබාදෙන රු.75,000 මුදල, මස්සැන්න පාර තෙරේසියාවත්ත මාර්ගයේ ඉහළ නිවාස වලට පිවිසීමට ඇති පඩිපෙළ සකස් කිරීමට යෙදවීමටත් ඒ සඳහා සභාවේ ඍජු ශ්‍රමය යොදා සිදුකිරීමටත් යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාවෙන් රු.75,000 මුදලින් අවශ්‍ය ගල් වැලි සිමෙන්ති මිලදිගෙන ඍජු ශ්‍රමය යොදා පඩිපෙළ සකස් කිරීම අදහස් කළ බව ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා පවසන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:13** ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා

**07:13:01** නාගරික සංවර්ධන අධිකාරියට අයත් සහකාර පොලිස් අධිකාරි කාර්යාලය ඉදිරිපිට ඉඩම සංවර්ධන කටයුත්තක් ආරම්භ කරනතුරු බළන්ගොඩ නගර සභාව වෙත බදු පදනම මත ලබාගෙන පදික වෙළඳාමේ නිරතව සිටි කිසිඳු අවස්ථාවක කඩ කාමර නොලැබුන කිහිපදෙනා වෙත සාධාරණ අයකිරීමක් සිදුකර ව්‍යාපාර කටයුතු සඳහා ලබාදීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත සඳහන් යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පසුගිය සභා වාරයේදීද මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කළ බවත්, කොමර්ෂල් බැංකුව හා ලංකා බැංකුව අතරමැදි නාගරික සංවර්ධන අධිකාරිය සතු මාර්ගය මේ සඳහා යොදා ගැනීමට ඉල්ලීම් කළද ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය අවසර ලබා නොදුන් බවත්, මෙම ඉඩම් කොටස ලබාදෙන ලෙස මෙම වෙළඳුන් පුද්ගලිකව ඉල්ලීම් කළද එසේ නොමැතිව සභාව මඟින් ඉල්ලීම් කිරීම සුදුසු බව පවසා ඇති බවත්,ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා සමඟ සාකච්ඡා කිරීමේදී එතුමාද පැවසුයේ සභාවෙන් යෝජනාවක් සම්මත කර සභාව බදු ලබාගෙන එම වෙළඳුන් වෙත ලබාදීමට නිසි ක්‍රමවේදයක් සකස් කිරීම සුදුසු බව පැවසූ බවත්, කාලෙක සිට පදික වෙළඳාමේ නිරත වන කඩ කාමර නොලැබුන පිරිසක් සිටින බැවින් ඔවුන්ට සාධාරණයක් සිදු කළ යුතු බවත්, මෙම යෝජනා කඩිනමින් ක්‍රියාත්මක විය යුතු බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා ඉහත යෝජනාවට තවත් කොටසක් ලෙස කඩ පේලියක් ඉදිකර බදු ලබාදීම සුදුසු බව යෝජනා කරන ලදී.ගරු උප සභාපතිතුමා පැවසූයේ එම ඉඩම්වල ඉදිකිරීම් කිරීමට අවසර ලබා නොදෙන බැවින් තාවකාලික ඉදිකිරීම් කිරීමට අවසර ලබා ගත යුතු බවත් ඒ අනුව ඉහත යෝජනාව සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත්ය.

**07:13:02** එළඹෙන උත්සව සමයේදී විවිධ වෙළඳ භාණ්ඩ සේල් තබා විකිණීම සඳහා පිටතින් බළන්ගොඩට පැමිණෙන වෙළඳුන් සහ ව්‍යාපාරිකයන්ට වෙළඳ බලපත්‍ර ලබාදීමට ප්‍රථම

බළන්ගොඩ වෙළඳ සංගමයේ සහ ව්‍යාපාරික සංසදයේ එකඟතා ලිපියක් ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳ අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ මින් පෙර පැවති සභාවන් වලදී මේ සම්බන්ධව නිසි ක්‍රමවේදයක් අනුගමනය කළ බවත්, විවිධ කාලවලදී විවිධ කණ්ඩායම් පැමිණියද බළන්ගොඩ ව්‍යාපාරික ප්‍රජාවගේ කැමැත්ත මත ක්‍රියාත්මක වූ බවත්, පසුගිය ආපදා කාලයේදී ජනතාව වෙත උදව් උපකාර කිරීම වෙනුවෙන් බළන්ගොඩ ව්‍යාපාරික ප්‍රජාව මැදිහත්වූ බවත්, එවැනි දේ වලට සිටින්නේ බළන්ගොඩ ව්‍යාපාරිකයන් බවත්, එබැවින් ඉදිරි උත්සව සමය වෙනුවෙන් ඔවුන්ගේ අනුමැතිය ලබාගෙන ඔවුන්ගේ ව්‍යාපාර ආරක්ෂා කරගෙන සහයෝගයෙන් සිදු කිරීමට ඔවුන් බලාපොරොත්තුවක් පවතින බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:13:03** බළන්ගොඩ නගර සභාව සතුයැයි ලේඛණගත මාර්ග අතුරින් මේවන විට ගැසට් කර ඇත්තේ මාර්ග කිහිපයකි. ඉතිරි මාර්ග ගැසට් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ බළන්ගොඩ නගර සභාව සතු මාර්ග 313 ක් පවතින බවත් ඉන් 129ක් පමණ මේ වන විට ගැසට් කර ඇති බවත්, ඉතිරි මාර්ග ගැසට් කිරීමට පවතින බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:13:04** 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබාදෙන රු.75,000 මුදල, ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලද ඇල්ලෙඅරාව එක්සත් මාවත නළ ළිඳ සාදා යෝජිත ජලයෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හිඟ ප්‍රතිපාදන වෙත ලබා දීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:14 ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

**07:14:01** 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබාදෙන රු.75,000 මුදල, මිරිස්වත්ත අල් ර්මාන් පෙර පාසලට පාසල් උපකරණ ලබා දීම සඳහා යෙදවීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:15 ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා**

**07:15:01** 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබාදෙන රු.75,000 මුදල, සියඹලාගහවත්ත පාර අනදමෙත්ගම මාර්ගයේ බැම්ම සකස් කිරීම සඳහා යෙදවීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:16 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා**

**07:16:01** 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබාදෙන රු.75,000 මුදල, අවිහිංසා සහන සංවිධානය වෙත ලිපක්, සාස්පාන් සෙට් එකක්, කබඩ් එකක් ලබා දීම වෙනුවෙන් යෙදවීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**විශේෂ යෝජනා**

**08:01** 2025 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන PSDG යටතේ නම්‍යශීලී අරමුදල් සඳහා වෙන්ව ඇති ප්‍රාග්ධන මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත අක්කර 18 මාර්ගය සංවර්ධනය කිරිමට අපේක්ෂා කරන බැවින්, එහි ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා නිලධාරින් පත් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

- කේ.එම්.එස්.සී.වේරහැර මහතා - සභාපති -නියෝජ්‍ය අධ්‍යක්ෂක (පළාත් පාලන)
- ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මහතා - සාමාජික -පළාත් පාලන සහකාර කොමසාරිස්
- එම්.ඩී.එස්.ප්‍රනාන්දු මහතා - සාමාජික - ප්‍රධාන ගණකාධිකාරී
- කේ.සී.සී.චතුරිකා මහත්මිය - සාමාජික - කාර්මික නිලධාරී
- එස්.එම්.සී.එස්.කේ අබේසිරිවර්ධන මයා-සාමාජික-කාර්මික නිලධාරී

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:02** පසුගිය ආපදා තත්වය හමුවේ කඩිනමින් ප්‍රතිසංස්කරණය කළ යුතු මාර්ග,බෝක්කු ආදිය නඩත්තු වෙනුවෙන් රු.මිලියන 01ක ප්‍රතිපාදන ලැබෙන බැවින් එම යෝජනා ක්‍රියාත්මක කිරීමට සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා සලකා බැලීම**

2025-11-14 දින පැවති මුදල් කාරක සභා වාර්තාව මෙදින ගරු සභාවට ඉදිරිපත් කළ අතර එකී වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සලකා බැලීම**

**2025 ඔක්තෝම්බර් මස ආදායම් වියදම් වාර්තාව**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | රු.11,580,371.47 |
| මූලධන ලැබීම් | රු.490,659,19 |
| වෙනත් ලැබීම් | රු.2,501,811.80 |
| මුළු ලැබීම් | රු.14,572,842.46 |
| පුනරාවර්තන වියදම් | රු.17,009,609.40 |
| ප්‍රාග්ධන වියදම් | රු.686,269.87 |
| වෙනත් වියදම් | රු.3,684,859.68 |
| මුළු වියදම් | රු.21,380,738.95 |

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් කොම්පොස්ට් ඒකකය, ජේ.සී.බී රථය, සම්පත් පියස යන අංශවල අදායම් ලැබිය හැකි වුවද ඌනතා පෙන්නුම් කරන බැවින් ඒ සම්බන්ධව හේතු මොනවාදැයි විමසන ලදී.

ඒ අනුව ගණකාධිකාරීතුමියගෙන් කරුණු පැහැදිලි කර ගැනීම වෙනුවෙන් ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්විය.

**2025 දෙසැම්බර් මස ඉන්ධන වාර්තාව**

| **2025 දෙසැම්බර් ඉන්ධන වාර්තාව** | |
|---|---|
| වාහන අංකය | මුදල |
| 226-7521 | 28810.77 |
| 227-5020 | 86746.54 |
| 37-7933 | 2770.00 |
| 56-1906 | 48475.00 |
| BC0005 | 66480.00 |
| DDR0008 | 24628.00 |
| DPP0006 | 41975.00 |
| GC0001 | 26490.00 |
| GK1483 | 30820.00 |
| GK6227 | 16620.00 |
| HF7899 | 107379.54 |
| HF8558 | 15498.00 |
| JD4684 | 4116.00 |
| LL7688 | 13850.00 |
| MM 8152 | 1470.00 |
| ND5124 | 31024.00 |

| | |
|---|---|
| PF4006 | 56231.00 |
| QL2901 | 5021.94 |
| RC 1107 | 8864.00 |
| RC1118 | 44772.00 |
| RC8183 | 43567.05 |
| RD8000 | 56792.67 |
| RD8240 | 90598.39 |
| UQ1933 | 2352.00 |
| VI1833 | 2940.00 |
| ZA9835 | 75417.00 |
| | |
| **Total** | **933708.90** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 10. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩි.වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් පැවසූයේ පසුගිය කාලයේ රටේ ඇති වූ තත්වය පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන බවත්, එමෙන්ම එම ව්‍යසන සමයේ මහියංගන රෝහල වෙත ශ්‍රී ලංකා අමරපුර නිකායේ උත්තරීතර මහානායක අනුරාධපුර භික්ෂු ශ්‍රාවක මහ නිකායේ කරගොඩ උයන්ගොඩ මෛත්‍රී මූර්ති නාහිමිපාණන් වහන්සේ ලොකු වෙහෙසක් දරා ලොකු ව්‍යාපෘතියක් රැගෙන රෝහලට වැඩම කළ බවත්, එය මුළු බළන්ගොඩටම ලොකු ආඩම්බරයක් බවත්, එම අවස්ථාවේ එම අසරණ වුනු ජනතාව ගොඩදැමීමට ලොකු කැප කිරීමක් කළ බවත්, ඒ අනුව ගරුතර ස්වාමීන් වහන්සේට තෙරුවන් සරණ ආශිර්වාදය ප්‍රාර්ථනා කරන බවත්,

එමෙන්ම පසුගිය සභාවන් වලදී සභාවේ සුභ සාධක සංගමය වෙත බැඳී සිටිය බවත්, එහිදී හැකි පමණින් සභාවේ සියළු දෙනාට උදව් උපකාර කළ බවත්, ඒ අනුව මෙම සාමාජික වීමට කැමති සභිකවරුන් එම සංගමය වෙත ඇතුළත් කර ගන්නා ලෙසත්, බස් නැවතුම්පොලේ වැසිකිළි ගැටළුව පිළිබඳව සලකා බලන ලෙසත්, වරිපනම් නොගෙවන සැහෙන පිරිසක් සභා සීමාවේ සිටින බවත්, ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙසත් පවසමින් එතුමියගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්සා මැතිතුමා අදහස් දක්වමින්, පසුගිය සමයේ ෆලීල් හාජියාර් මාවත සම්පූර්ණයෙන්ම අබලන් වී ඇති බවත්, ජනතාව විශාල වශයෙන් චෝදනා කරන බවත්, එම මාර්ගයේ විථි ලාම්පු එකක් වත් නොමැති බවත්, ඒ පිළිබඳව සොයා ලබන ලෙසත්, බෙතල්හිල් මාවත

විශාල අවධානම් තත්වයක පවතින බවත්, ගල් කඩා ගෙන ඒමේ අවධානමක් පවතින බවත්, ඒ ගැන කිසිවෙකු සොයා බලන්නේ නැති බවත්, විලියම් මාවතේද එක වීථි පහනක් හෝ දැල්වෙන්නේ නැති බවත්, ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙසත්, වරිපනම් සම්බන්ධව නගර සභාවට පවරාගත් සීමාවේ මේ වන විට වරිපනම් අංක නොදුන් ඒකක සැහෙන ප්‍රමාණයක් පවතින බවත්, විදුලිය ජලය ලබා ගැනීමේදී ඔවුන්ට ගැටළුවක් වන බවත්, එම ඒකක පිළිබඳ සොයා බලා වරිපනම් අංක ලබාදී සභාවට ලබා ගත හැකි ආදායම ලබා ගැනීමට අදාළ කටයුතු සිදු කරන ලෙසත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එන්. ඒ. එස් චන්දන මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා අදහස් දක්වමින් පසුගියදා ලංකාවටම පැවති සුළි කුණාටු තත්වය හේතුවෙන් ජීවිත අහිමි වූ සියළු දෙනා වෙනුවෙන් ශෝකය පළ කරන බවත්, මේ මොහොත වන විටත් ලංකාවේ සැලකිය යුතු පිරිසක් ආපදාවට ලක්වී සිටින බවත්, දින 07ක් මහියංගනය ප්‍රදේශයට ගොස් 250ක පමණ පිරිසක් පාසලක නැවතී නිවාස පිරිසිදු කිරීම,ළිං පිරිසිදු කිරීම. ගස් කැපීම ආදී විශාල කාර්යයන් රැසක් සිදුකළ බවත්, බළන්ගොඩ ජනතාව විශාල වශයෙන් උදව් උපකාර කළ බවත්, දින 07 ඇතුළත 350-400 පමණ පිරිසක් ඒ වෙනුවෙන් සම්බන්ධ කිරීමට හැකියාව ලැබුන බවත්, ඒ වෙනුවෙන් බළන්ගොඩ ජනතාවට ස්තූතිය පුද කරන බවත්, සභාවෙන් කෘ කැබ් රථය එම කටයුතු සඳහා යෙදවූ බවත්, සභාවේ රියදුරු මහතෙකු වන අතුල මහතා මහන්සි වී වැඩ කටයුතු සිදු කළ බවත්, ඒ අනුව සභාවෙන් වාහන ලබා දීම සහ අතුල මහතා සම්බන්ධ කරවීම පිළිබඳව සභාපතිතුමාටත්, ලේකම්තුමියටත් ස්තූතිවන්ත වන බවත්,

එමෙන්ම ආපදා තත්වය හමුවේ රජයක් ලෙස ජනතාව වෙත විශාල සහන ප්‍රමාණයක් සහිත සහන පැකේජයක් ලබා දී තිබෙන බවත්, එහිදී නිවාස පිරිසිදු කිරීමට රු.25,000ක්ද, නිවස සහ ඉඩම යන දෙකම හානි වී ඇත්නම් රු කෝටියක් දක්වාද, පාසල් දරුවන්ට උපකරණ ලබා ගැනිමට රු.25,000ක්ද, අලාභහානි සිදු වූ නිවාසයක් සඳහා රු ලක්ෂ 25 ක උපරිමයකට යටත්ව වන්දි ලබාදීමටත්, එසේම අද දින සිට බදුල්ල ප්‍රදේශයේ හානි වී ඇති වාරිමාර්ග ප්‍රතිසංස්කරණය වෙනුවෙන් 5000ක පමණ පිරිසක් සම්බන්ධ කරගෙන වාරි මහිමය නමින් ව්‍යාපෘතියක් ආරම්භ කරන බවත් අද දින සිට සිට 23 වෙනිදා දක්වා එය පැවැත්වෙන බවත්, සභාව ලෙස එයට සම්බන්ධ වීමට හැකියාව ඇති අයට එයට සම්බන්ධ වීමට ආරාධනා කරන බවත්, සභාවේ සේවකයන් සහ කාර්ය මණ්ඩලය සමඟ බදුල්ලේ ශ්‍රම මෙහෙයුමක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ බවත්, ඒ අනුව ඒ සඳහා සෙනසුරාදා දිනයක් යොදා ගැනීම සුදුසු බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විශේෂ මහ සභා දිනයක හෝ බැංකියවත්ත අධීක්ෂණය කිරීමට සභාවේ සියළු දෙනා සහභාගි වීමට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී එච්. ඒ. එච්. එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් පසුගිය දිනවල විපතට පත් සහෝදර ජනතාව වෙනුවෙන් කණ්ඩායමක් ලෙස ශෝකය ප්‍රකාශ කරන බවත්, හැකි ප්‍රමාණයට ඒ වෙනුවෙන් දායකත්වය ලබා දුන් බවත්, ඉදිරියේදීත් ඒ වෙනුවෙන් උදව් උපකාර කිරීමට බලාපොරොත්තු වන බවත්, බළන්ගොඩ පෙට්ටිගල මාර්ගය පළාත් සභාවට අයත් බවත්, මේ වන විට තැනින් තැන වලවල් හැරී ඇති බවත්, එමෙන්ම කාණු පද්ධතිය පිළිසකර වෙලාම නැති බවත්, එබැවින් මේ සම්බන්ධව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත යොමුකර එම මාර්ගය පවරා දීමට කටයුතු කර, එවිට මෙහි නඩත්තු කටයුතු සිදුවනු ඇති බවත්, ඒ අනුව පෙට්ටිගල පාර නගර සභාව දක්වා කොටස පළාත් සභාව වෙත පවරා දී එහි නඩත්තු කටයුතු සිදුකර දෙන ලෙස ඉල්ලීම් කරන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී. එන් සේනාරත්න මැතිතුමා අදහස් දක්වමින් එතුමාගේ යෝජනා තුළට පවතින තොග ශේෂය ලබාදෙන ලෙස ඉල්ලීම් යොමු කළ නමුත් එම තොරතුරු නොලැබුන බවත්, ජනතා නියෝජිතයන් ලෙස ජනතාවට වග කියන බවත් වගකීමෙන් බැඳෙන බවත්, ඒ පිළිබඳ කණගාටු වන බවත්, ඉදිරි වර්ෂයේ ජනවාරි සිට සභාවේ වැඩ කටයුතු සාර්ථකව සිදුකර ගැනීමට සියළු දෙනාගේ අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙසත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් කාර්යාලයේ සේවක මහත්ම මහත්මීන් වෙත දස මස වැටුප් අත්තිකාරම් මුදල ලබා දීමේදී ප්‍රමුඛතා ලේඛනයක් තිබේද යන්නත්, සභාවේ අමිල මහතා සිදු වූ අසනීප තත්වය හේතුවෙන් එම ණය මුදල ලබා දෙන ලෙස ඉල්ලීම් කළ ද මුදල් කමිටුවෙන් එයට නිර්දේශය ලබා දී නොතිබුන බවත්, නමුත් ප්‍රමුඛතාවය ලබාදිය යුතු එවැනි අවස්ථා වලදී සංවේදී වී කටයුතු කරන ලෙසත්,

දැනට ක්‍රීඩා පිටියට යන්න විදියක් නෑ තණකොළ කපලා නැත්තේ ඇයිද යන්න ජනතාව විමසන බවත්, ඇවිදින මංතීරුවේ ක්‍රීඩා උපකරණ සවිකර ඇති වුවද වැඩ අවසන් නොමැති බවත්, මාස පහක් ගත වී ඇති බවත්, ඒ පිළිබඳ කණගාටු වන බවත්, මෙවැනි සුළු වැඩ පවා නොවීමට හේතුව නොදන්නා බවත්, නගරයේ විවිධ ස්ථාන වල ස් ලැබ් කොටස් ගැලවී කාණු තුළට වැටී ඇති බවත්, වැසි කාලය හේතුවෙන් අවදානම් බවත්, කලින් නම් මේවා කඩිනමින් පිළිසකර වන බවත්, නමුත් දැන් ඒ

ආකාරයෙන් වැඩ සිදු නොවන බවත්, විශේෂයෙන් මේවා සොයා නොබැලීම පිළිබඳව අවධානය යොමු කරන ලෙසත්, ඔරලෝසු කණුවේ වෙලාව යන්නේත් නැති බවත්, මේවා විශාල මුදල් වැය වන කාර්යයන් නොවන බැවින් අවධානය යොමුකර එම කාර්යයන් සිදු කරන ලෙසත්, සුසාන භූමියේ ගස් කැපීමට මිල ගණන් කැඳවා ඇති බව කලින් සභාවේ පැවසුවද එලෙස රජයේ දේපල වල ගස් කැපීමට පුද්ගලික අංශයට නොහැකි බවත්, ගස් කැපිය හැක්කේ රාජ්‍ය දැව සංස්ථාවට පමණක් බවත්, කපන්නේ නැත්තේ බෝගස් පමණක් බවත්, දිගින් දිගටම මෙලෙස සභාවේ අඩුපාඩු පැවසීමට ඉඩ තැබීමෙන් සභාව පිළිබඳ කළකිරෙන බවත්, ජනවාරි මස සිටවත් මෙම සභාවෙන් නිවරදි මහජන සේවාවක් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සලසන ලෙසත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එච්. ඒ.එච්.එන් හෙට්ටි ආරච්චි මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ අමිල මහතාගේ හදිසි අනතුර පිළිබඳ නොදන්නා බවත්, ඔහුගේ ආපදා ණය ලබා ගැනිමේ ඉල්ලීම පසුගියදා පැවති මුදල් කමිටුවට ඉදිරිපත් නොවුන බවත්, ඉදිරිපත් වූයේ නම් එම මහතාගේ හදිසි තත්වය සලකා එය ලබා දීමට කටයුතු කරන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා පසුගියදා පැවති ආපදා තත්වය හමුවේ විවිධ මාධ්‍යය ආයතන මැදිහත්වී අසරණ වූ ජනතාවට සහන සේවා ලබාදුන් බවත්, නගරයේ විවිධ තැන් වල ද ආහාර ආදී සහන සේවා එකතු කරන මධ්‍යස්ථාන ක්‍රියාත්මක කරන බවත්, මේ සම්බන්ධව සතුටු වන බවත්, 2006 සිට තමන් සභාව නියෝජනය කරනු ලබන බවත්, එමෙන්ම තමන් නියෝජනය කළ සභාවන් අතුරින් මෙම සභාව ඉතාම අශෝභන සභාවක් බවත්, ඒවායේදී සභාවේ මන්ත්‍රීවරයෙකු කතා කිරීමේදී තවත් අයෙකු කතා නොකරන බවත්, ඒ පිළිබඳව බලවත් කණගාටුව ප්‍රකාශ කරන බවත්, ලබන්නා වූ නව වසර සියළු දෙනාටම සුභ නව වසරක් වේවා යන්නත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.බී වසන්ත කුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. බී වසන්ත කුමාර මැතිතුමා අදහස් දක්වමින් න්‍යාය පත්‍රයට අදාළ සියළු කාරණා සභාවේ පැවතිය ද සභාවට පැමිණෙන්නේ නැති බවත්, ජනවාරි මස සිටවත් සභාවට එම අදාළ තොරතුරු නිවරදිව සපයන ලෙස නිලධාරී මණ්ඩලයෙන් ඉල්ලුම් කරන බවත්, න්‍යාය පත්‍රයට අදාළ සියළු තොරතුරු දත්ත ඇතුළත් කර සකස් කර ලබා දෙනු ඇති බවට බලාපොරොත්තු වන බවත් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ වසන්ත ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් සභාව පත් වූ දා සිට මෙම සභාවේ අසන්නට ලැබෙන්නේම නොකෙරුන දේවල් පිළිබඳ අදෝනා බවත්,සභාවේ යම් දුර්වලකමක් සැමවිටම මතු කළ බවත්, එයට කවුරුවත් තරහ නොවිය යුතු බවත්, තමන් මෙම සභාවේ වැඩිම කාලයක් විවිධ සභාපතිවරු සමඟ වැඩ කළ බවත්, ඒ අනුව බැලීමේදී එම සභාවන් සහ මෙම සභාව අහසට පොළොව වැනි බවත්, කර්මාන්ත කමිටුවේ සභාපතිතුමා වීම දුක්වන බව පැවසූ බවත්, එතුමාගේ එම කතාවට දුක හිතෙන බවත්, සභාවන් වල පක්ෂ විපක්ෂ මන්ත්‍රීන් සිටියද කිසි විටෙක කිසි කෙනෙක් වැඩ කලේ නැති බව පැවසුයේ නැති බවත්, වැඩ කරන්න දැනගෙන සිටි බවත්, පැනලා මෙය බඳාගෙන කරන්න බැරි බවත්, වැඩ කරන්න බැරි නිලධාරී පිරිසක් සභාවේ නොමැති බවත්, වැඩ ගන්න දන්නේ නැති බවත්, හිටපු හැම සභාවකම හොඳට වැඩ කළ බවත්, විමලසේන සභාපතිතුමාගේ සභාව කාලයේ දුර්වල සභාවක් පැවති බවත්, නමුත් එම සභාවද මීට වඩා හොඳට වැඩ කළ බවත්, ජනතාව මීට වඩා සේවාවක් බලාපොරොත්තු වූ බවත්, හැම අංශයම වැටීමක් පමණක් තිබෙන බවත්,

එසේම මෙම සභාවේ නිලධාරීන් සභාව සමඟ සම්බන්ධ නැති බවත්, ඒකට කැමති නැති බවත්, මන්ත්‍රීවරු සාමුහික හැඟීමක නොසිටින බවත්, සභාපතිතුමාට සමහර මන්ත්‍රීවරු උදව් නොකරන බවත්, එතුමා ගෙන එන යෝජනා වලට විරුද්ධ වන බවත්,එසේ කලින් සභාවන් වල පැවතිය ද එම සභාවන් වල වැඩ කළ බවත්, හොඳම උදාහරණය තානායම බවත්, සභාවේ අද දිනයේද විවිධ කාරණා සම්බන්ධව මන්ත්‍රීවරුන් ප්‍රශ්න අසනු ලැබූ බවත්, නමුත් පෙර සභාවන් වලදී සිටි ගණකාධිකාරිතුමා වන දයාන් ප්‍රනාන්දු මහතා එවැනි දේවල් සිදු වීමට ඉඩ නොතැබූ බවත්, කොතනද වැරද්ද යන්න දන්නේ නැති බවත්, මෙම සභාව වාර්ෂික වාර්තා සහ ගිණුම් තැබීමට ලංකාවේ පළමු වෙනි ස්ථානය ලබා ගත්තද අද එම ස්ථානයද අහිමි වී ඇති බවත්, යෝජනා ගෙනවිත් පොරකන්න දඟලන්නේ නැති බවත්,වැඩක් නැති බව දන්නා බැවින් එසේ කරන බවත්, සභාවේ අවිධිමත් බවක් පවතින බවත්, සභාව වැටෙන්න දෙන්න එපා යන්නත්, පන්සලත් එක්ක ගොඩක් සම්බන්ධ බැවින් මන්ත්‍රී ප්‍රතිපාදනය පෙරහැර වෙනුවෙන් ලබා දුන් බවත්, මාධ්‍යවේදී දිමනාව එක් දීමනාවක් රඳවා ගෙන ගෙවන්නේ ඇයිද යන්නත් එය ලබා දෙන්නේ මන්ත්‍රී දීමනාවෙන් බවත්, අයවැයට විපක්ෂ වූයේ තම පක්ෂයෙන් ලද තීරණයක් අනුව බවත්, කාටවත් රිදවීමට එය නොකෙරූ බවත්, සභාපතිතුමා ද එය පිළිගත් බවත්, එතුමාද නියෝජනය කළ සෑම සභාවාරයකදීම එවකට පැවති අයවැයට විරුද්ධ වූ බවත්, ලබන්නා වූ නව වසර වැඩ කටයුතු නිවරදිව කරගෙන යාමට සභාපතිතුමාගේ පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාටත් වඩා සහයෝගය ලබා දෙන බවත්, සභාපතිතුමා බොහොම අවංක නිහතමානි සරල මනුස්සයෙක් බවත්, වැඩේ කෙරෙන්නේ නැති එක පමණක් ගැටළුවක් පවත්, ලේකම්තුමිය ඇමතීමේදී එතුමිය කලින් විශ්‍රාම ලබා ගන්නා බව පැවසූ බවත්, එතුමිය පළාත් පාලනය පිළිබඳව විශේෂඥයෙක් බවත්, යම් කළකිරීම් සිත් රිදවීම් වන බවත්, එතුමියගේ වටිනා සේවය තව කාලයක් සභාව වෙත ලබා දෙන

ලෙසත්, ගණකාධිකාරීතුමිය පළාත් පාලනය පිළිබඳව සැලකීමෙන් කටයුතු කරන ලෙසත් දේශපාලනයත් සමඟ කටයුතු කිරීමට සිදුවන බැවින් එසේ පවසන බවත්, පසුගිය වර සභාවේ අයවැය ලේඛනය පිළිබඳ විවාදයක් වූ බැවින් වෙනත් අයවැයන්ද ගෙනවිත් පෙන්වූ බවත්,නමුත් තමන් එම අවස්ථාවන් වලදී ද සමානව නම් දැමීමට විරුද්ධ වූ බව පැවසූ බවත්, එසේම සෑම තැනකම දේශපාලන අධිකාරිය මුලින්ම පවතින බවත්, ඉදිරියේදී මුද්‍රණය කරනු ලබන අයවැය ලේඛනයේ සභාපතිවරයාගේ නම මුලින්ම පැමිණිය යුතු බවත්, ඉන් පසුව නිලධාරින් ලෙස එතුමියන්ලාගේ නම් පැමිණිය යුතු බවත්, ප්‍රාදේශීය සභාවේ අයවැය වර්තා කිහිපයක් පවතින බවත්, ඒවායේද තමන් පවසන ආකාරයට නම් පවතින බවත්, පරණ අවුරුද්දේ කාට හෝ වැරැද්දක් වූවා නම් සමාව ඉල්ලා සිටින බවත්, ඒ අනුව ලබන වසරේ ජනතාවට සේවය කිරීමට විශාල ලෙස බලාපොරොත්තු වී සිටින බවත්, එලෙස ඉදිරි වැඩ කටයුතු සාර්ථකව සිදු කිරීමට අවශ්‍ය පරිදි මෙම රජයට ශක්තිය ධෛර්ය ලැබේවා යන්නත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

### 11. අවසානය

අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදී කණ්ඩායම සඳහා ස්තූතිය පුද කරන බවත්, සහ මෙම වර්ෂයට පවත්නා අවසන් සභාව බවත්,කරුණු රැසක් මෙන්ම යම් යම් ගැටළු ඇතිවන්නේ මන්ත්‍රීවරුන් නවකයන් වීම හේතුවක් බවත්, තවමත් මන්ත්‍රීතුමන්ලා අත්දැකීම් ලබමින් යන බවත්, ඒ සමඟ ඉදිරියට වැඩ කටයුතු නිවරදිව සිදු කිරීමට හැකි වනු ඇති බවත්,බළන්ගොඩ ජනතාව බලාපොරොත්තු වන මහජන සේවාව නිවරදිව ලබා දීමට සියළු දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙසත්, ලබන 2026 වර්ෂය සියළුම දෙනාට සුභ නව වසරක් වීමට සුභ පතන බවත් දන්වමින් ප.ව.3.00ට පමණ මෙදින මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

කේ.ජී.පේමදාස,

සභාපති,

බළන්ගොඩ නගර සභාව.